# වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්

# Annual Performance Report & Accounts

## வருடாந்த செயலாற்றுகை அறிக்கையும் கணக்குகளும்

## 2016



**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

உள்நாட்டலுவல்கள் அமைச்சு

**Ministry of Home Affairs**

## අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය



**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන**

දේශපාලන බලය මෙන්ම පරිපාලන ක්‍රමය උපරිම වශයෙන් විමධ්‍යගතව පැවැතීම දියුණු ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අනිවාර්ය අංගයක් විය යුතු බව පොදු පිළිගැනීමයි. ප්‍රත්‍යන්ත වැසි ජනයා තම පරිපාලනය හෝ අනෙකුත් ගැටලු විසඳා ගැනීම වෙනුවෙන් දෛනිකව නගර වෙත පැමිණීම ඔවුන්ගේ ජන ජීවිතය අඩාල වීමට මෙන්ම නාගරිකව ප්‍රවාහන හා තවත් බොහෝ ගැටලු නිර්මාණයටද හේතුවක් වී ඇත.

ජනතාව සමීපයට ගොස් ඔවුන්ගේ ගැටලු හඳුනා ගනිමින් කඩිනම් විසඳුම් සැලසීම, ජනතා සම්මුතියෙන් බලයට පැමිණි රජයක පරම අභිලාෂයයි. අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ අප රජය පරිපාලනයේ පවත්නා සංකීර්ණ තත්ත්වයන් ජය ගනිමින්ද, ප්‍රායෝගික දුෂ්කරතා අවම කර පොදු මහජනතාවට සෙත සැලසීම සඳහා මේ වන විට පියවර රාශියක් ගෙන ඇත.

ඒ අතරින් ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමාගේ මැදිහත්වීම මත ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සංවිධානය කරන නිල මෙහෙවර ජනපති ජනතා සේවය ඔස්සේ හඬක් නැති ජනතාවට පෘතුල සේවාවක් ඉටු කිරීමට මේ වන විට කටයුතු සංවිධානය කර ඇත.

ඊට අමතරව ප්‍රාදේශීය පරිපාලනය ශක්තිමත් කිරීම උදෙසා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිලි රැසක් ඉදි කිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය පියවර ගෙන ඇත. ඒ තුළින් වඩා කාර්යක්ෂම, ගුණාත්මක හා විශ්වාසනීය මහජන සේවයක් ඇති කිරීම අප රජයේ අරමුණයි.

ස්වදේශ කටයුතු අමාත්‍යතුමා ප්‍රමුඛ එම අමාත්‍යාංශය ගෙන යන වැඩපිළිවෙළ සඳහා රජයක් ලෙස අප පූර්ණ ආශිර්වාදය සහ අනුග්‍රහය දක්වන අතර ඔවුන්ගේ එම ප්‍රයත්නයට ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කරමි.

## ගරු අග්‍රාමාත්‍යතුමාගේ පණිවුඩය



**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ**

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ විශේෂ උපදෙස් පරිදි නිරන්තරයෙන් කටයුතු කරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකාව තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 ක්, ග්‍රාම නිලධාරි කොට්ඨාස 14,022 ක් සහ ආර්ථික සංවර්ධන නිලධාරින් 17,000 කගෙන් සමන්විතය.

රාජ්‍ය අංශයේ මැදිහත්වීම මත ඉටුකර ගත යුතු සේවා අවශ්‍යතාවන් මෙන්ම විසඳුම් ලබාගත යුතු ගැටලු රැසක් පොදු ජනතාව වෙත ඇති බව අපි දනිමු. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ජනතාවට වඩාත් සමීප පුළුල් සේවාවක් කිරීමේ පරමාර්ථයෙන් මේ වන විටත් පියවර රාශියක් ගෙන ඇත. ජනතාව නිලධාරින් පසුපස යනවා වෙනුවට නිලධාරින් ජනතාව ළඟට ගොස් සේවය කිරීමේ ජනපති ජනතා සේවය ජාතික වැඩසටහනක් නිල මෙහෙවර නමින් මේ වන විටත් ආරම්භ කර ඇත.

එමෙන් ම ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ඉටු කරනු ලබන සේවාව වඩා කාර්යක්ෂම හා ඵලදායි කිරීම ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමාගේ අපේක්ෂාවයි. මේ සඳහා රාජ්‍ය නිලධාරීන්ට යහපත් මානසිකත්වයකින් යුතුව රාජකාරියෙහි යෙදීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කරදීම තම වගකීමක් ලෙස ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හඳුනාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශීය පරිපාලනය ශක්තිමත් කිරීමට දිවයින පුරා නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඉදිවෙමින් පවතින අතර සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකම සේවා පියස බැගින් ආරම්භ කිරීම ද අමාත්‍යාංශයේ ඊළඟ අරමුණයි.

මේ නිසා පොදු මහජනතාවගේ සුභසිද්ධිය උදෙසා වජිර අබේවර්ධන මැතිතුමන් නායකත්වය දෙන ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මෙවර ජාතික අයවැය මගින් අවශ්‍ය පුළුල් ප්‍රතිපාදන ලබාදීමට අප රජයක් ලෙස කටයුතු කර ඇති බව සතුටින් සඳහන් කළ යුතුව ඇත.

## ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය



**ස්වදේශ කටයුතු ගරු අමාත්‍ය**
**වජිර අබේවර්ධන**

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නිපුන නායකත්වය යටතේ සියලුම ශ්‍රී ලංකිකයින් සඳහා වඩාත් යහපත් හෙට දිනයක් ඇතිකරලීම වෙනුවෙන් අප රජය නොසැලෙන කැප කිරීමකින් යුක්තව තවදුරටත් කටයුතු කිරීමට බැඳී සිටිනවා. අපගේ ජනවතාවට සුවිශේෂී ආර්ථික ප්‍රතිලාභ ලබාදීම වෙනුවෙන් අප යන අභියෝගාත්මක ගමන් මඟ අද්විතීය දේශපාලන පසුබිමක් තුළ සකස්ව ඇති අතර එය ඉලක්කගත සමෘද්ධිය කරා පිය නැගීමට බෙහෙවින් උපකාරී වේ. ශ්‍රී ලංකාවේ සෑම කෙනෙක්ම ඇතුලත්වන සමාජ සංවර්ධනයක් ඇති කිරීමට පහසුකම් සැලසීම සඳහා පුළුල් ප්‍රතිපත්තියක් සකස් කරනු ලැබේ. සංවර්ධන ක්‍රියාවලියට රටේ සැමදෙනාම ඇතුලත්වීම මූලිකව සැලකිල්ලට ගත යුතු අවශ්‍යතාවයක් ලෙස සැලකේ. සංවර්ධනය සඳහා වන ගමනේදී සමස්ත ජන සමාජයේ සහභාගීත්වය ලබා ගනිමින් "සැමට සමාජයක්" යන සංකල්පය අනුව කටයුතු කිරීම ශ්‍රේෂ්ඨ අරමුණකි. මේ අනුව "සැමට ප්‍රතිලාභ හිමිවන වේගවත් වර්ධනයක් කරා " යන්න 2017 වර්ෂයේ ජාතික අයවැයෙහි පුළුල් තේමාවයි.

අන්‍යෝන්‍ය ගෞරවය හා සම්මුතිවාදය පාදක කොට, නව දැක්මක් තුළ තිරසාර සාමයක් ස්ථාපනය කරලීම උදෙසා අප රට තුළ සමාජීය, දේශපාලනික, ආර්ථික සහ ජාත්‍යන්තර සබඳතා වැනි වැදගත් ක්ෂේත්‍ර සියල්ල ඇතුළත් වන පරිදි අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ රාශියක් අප විසින් සකස් කර ඇත. ජාතීන් අතර පොදු එකඟතාවය මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවශ්‍ය ප්‍රතිසංස්කරණ, රට තුළ නීතිය ශක්තිමත් කිරීම සහ අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කරලීම සඳහා අපගේ රජය කේන්ද්‍රගත වනවා. විසි එක්වන ශත වර්ෂයට ගැලපෙන පරිදි නව තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් ජාතික මූල්‍ය ප්‍රතිපත්ති අනුව කටයුතු කරමින් පුරවැසියන්ගේ බදු මුදල් වියදම් කරන ආකාරය ප්‍රසිද්ධ කිරීම වැදගත් කාර්යයක් වේ.

මෙම අමාත්‍යාංශයේ 2016 වර්ශයේ ප්‍රගතිය සහ 2017 වර්ශයේ අයවැය සැලසුම පුරවැසියන් පරිශීලනය කිරීම තුළින් අප වගවීමෙන්, පාරදෘශ්‍යභාවයකින්, ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කරන්නා වූ කටයුතු පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා වන අයිතිය උදා කර දෙනු ලැබේ. අපගේ ප්‍රමුඛ පරමාර්ථය වන්නේ රට සංවර්ධනය කිරීම වෙනුවෙන් ජාතික වශයෙන් ඉතා වැදගත් වන පුළුල් ප්‍රතිපත්ති රාශියක් ඇතුලත් වන පරිදි රැකියා අවස්ථා දස ලක්ෂයක් ඇති කිරීම, ආදායම් මට්ටම් ඉහළ දැමීම, ග්‍රාමීය ආර්ථිකය වර්ධනය කිරීම, වැඩ කරන වතු ජනතාව සහ ග්‍රාමීය ජනතාව මෙන්ම මධ්‍යම පාන්තිකයන් සහ රාජ්‍ය සේවකයින් වෙත ඉඩම් අයිතිය ලැබෙන බවට සහතික වීම සහ එමගින් වඩා ශක්තිමත් මධ්‍යම පාන්තිකයින් පිරිසක් බිහිකරවීමයි. එමෙන්ම, දිළිඳුකම දුරලීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් කෙරෙහි සුවිශේෂී අවධානයක් 2017 වර්ෂය ආරම්භයේ සිටම යොමු කරනු ලබනවා.

## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



**ස්වදේශ කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය**
**ඩබ්.ජේ. නිමල් ලන්සා**

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන දැක්ම මූලික කරගෙන, දශක තුනක කුරිරු යුද්ධයේ නිමාව සමඟම අරුණළු නැගෙනා උතුරේ මෙන්ම දකුණේ මහජනයා හට කාර්යක්ෂම වූ සේවාවක් ලබාදීමට අපි කැපවී සිටින්නෙමු.

ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමාට මාගේ පූර්ණ සහයෝගය ලබාදෙමින් හා එතුමාගේ මඟ පෙන්වීම යටතේ උපරිම කාර්යක්ෂමතාවයෙන් යුත් ගුණාත්මක රාජ්‍ය සේවාවක් ගොඩනැංවීම සඳහා වන ප්‍රයත්නයට මාගේ පූර්ණ දායකත්වය ලබාදීමට කැපවී සිටින බව සඳහන් කරනු කැමැත්තෙමි.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අරමුණු හා ඉලක්ක, අතීතයේ ලද අත්දැකීම් පදනම් කරගනිමින් වඩා ඵලදායී ලෙස උපාය මාර්ගිකව මෙහෙයවීමට අමාත්‍යාංශයේ සමස්ත කාර්යය මණ්ඩලයත් අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්යය මණ්ඩලයත් රාජ්‍ය සේවයේ පෙර ගමන්කරුවන් වශයෙන් පෙළ ගැසී සිටින බව ප්‍රකාශ කරනු කැමැත්තෙමු.

## ලේකම්තුමාගේ පණිවුඩය



**නීල් ද අල්විස්**
**ලේකම්**
**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන දැක්ම, මෙහෙවර, අරමුණු සහ කාර්යයන් මූලික කර ගෙන නව අමාත්‍යාංශයක් ලෙස රාජ්‍ය සේවයේ උපක්‍රමික සැලසුම් උපයෝගී කර ගෙන නව මාවතක් අරභයා මහජනතාවට ඉතා සංවේදී සහ මහජනතාවට නැඹුරු වූ රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම සඳහා අපි කැප වී සිටින්නෙමු.

පසුගිය වසර පුරාවට රාජ්‍ය අංශයේ කටයුතු විධිමත් කිරීමෙහි ලා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කල සේවය ඇගයිය යුතු වේ. ඒ සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරි කාර්යාල විසින් විශිෂ්ඨ දායකත්වයක් ලබාදී ඇති බව සිහිපත් කරන්නේද ස්තුති පූර්වකවය.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පුළුල් ජනතා සේවයක් වෙනුවෙන් කැප වී සිටියි. විසිඑක් වන ශතවර්ෂයට ගැලපෙන පරිදි ජනතා අපේක්ෂා ඉටුකිරීමෙහිලා සමීප සේවාවක් ලබාදීමට නවීන තොරතුරු තාක්‍ෂණය යොදා ගැනීමට කටයුතු කර තිබීම ද ඉතා ප්‍රතිඵලදායකය.

මෙතෙක් ආ මඟ තුළ අප ලත් අත්දැකීම් පෙරදැරි කරගෙන ඉදිරියටත් මහජනතාව වෙත කාර්යක්ෂමවූත්, ඵලදායීවූත් රාජ්‍ය සේවයක් ඉටු කිරීම තුළින් රටේ පරිපාලන ව්‍යුහය, යහපාලනය හා සංවර්ධනය සඳහා අප අමාත්‍යාංශයේ උපරිම දායකත්වය ලබා දී ඇත

## දැක්ම

ජාතියේ උන්නතිය උදෙසා වන සුවිශේෂ සේවාවක් සැපයීම.

## මෙහෙවර

නිපුනතාවයෙන් හෙබි මානව සම්පත් උපයෝජනය සහිත ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රශස්ත පරිපාලන ක්‍රමයක් තුළින් විශිෂ්ට තම සේවාවක් තහවුරු කිරීම.

## අරමුණු


- ජනතාවට වඩා සමීපවූ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් සහිත දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය පරිපාලන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- ග්‍රාමීය, ප්‍රාදේශීය හා සමස්ථ ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා සහභාගීත්ව සහ සාමූහික ප්‍රවේශයක් ස්ථාපිත කිරීම.
- ඒකාබද්ධ ප්‍රවේශයක් සහ ජනතාවට වඩා සමීප වූ රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.
- නවීන තොරතුරු තාක්ෂණික සම්බන්ධතාවය ශක්තිමත් කරමින් දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය පරිපාලනය ශක්තිමත් කිරීම.
- කාර්යක්ෂම , ඵලදායී හා ගුණාත්මක බව ඇතිවන පරිදි මානව සම්පත අභිප්‍රේරණය කිරීම.

## උපාය මාර්ග

1. මහජන වගකීම හා සංතෘප්තිය සහතික වන සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවිධාන ව්‍යුහයන් සරල කිරීම හා නැවත නිර්ණය කිරීම.
2. සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව එකම වහලක් යටතට ජාලගත කිරීම.
3. සේවාලාභීන්ට හිතැති හා ප්‍රතිචාර දැක්විය හැකි සේ කාර්යාල පද්ධතිය වැඩිදියුණු කිරීම.
4. සෞඛ්‍යාත්මක ප්‍රවර්ධනාත්මක පරිසරයක් තුළ ආකර්ෂණීය ගෙවීම් පටිපාටියක් ඇතිකරමින් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවකයන් බලගැන්වීම හා අභිප්‍රේරණය කිරීම.

## මූලික කාර්ය දර්ශක (KPI)

1. මානව සම්පත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය.
2. අදාල නිලධාරි කණ්ඩායම් පුහුණු කිරීම සඳහා වැය කළ වාර්ෂික පුහුණු පැය ගණන.
3. දිස්ත්‍රික් / ප්‍රාදේශීය පරිපාලනයට අදාල මහජන පැමිණිලි / ඉල්ලීම් සඳහා විසඳුම් ලබාදීමේ ප්‍රතිශතය.
4. උපත් / විවාහ / මරණ ආදී ලේඛණ නිකුත් කිරීම සඳහා ගතවන කාලයෙහි සාමාන්‍යය.





## ප්‍රධාන කාර්යයන්

- ස්වදේශ කටයුතු විෂයයට සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සියළු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම.
- රාජ්‍ය උත්සව සංවිධානය කිරීම.
- ග්‍රාම රාජ්‍ය කේන්ද්‍රයන්හි සීමා නිර්ණය කිරීම.
- ග්‍රාම රාජ්‍ය කේන්ද්‍ර මණ්ඩල පිහිටුවීම.
- දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ මණ්ඩල පිහිටුවීම හා පැවැත්වීම.
- උපත්, විවාහ හා මරණ ලියාපදිංචියට අදාළ කටයුතු සිදු කිරීම.
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවල, සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට පැවරී ඇති සියලුම විෂයන්ට අදාළ කටයුතු කිරීම.
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරි කාර්යාල අධීක්ෂණය කිරීම.

| අනු අංකය | පළාත | දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | ග්‍රාම නිළධාරි කොට්ඨාශ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මධ්‍යම පළාත | 03 | 36 | 2224 |
| 02 | නැගෙනහිර පළාත | 03 | 46 | 1079 |
| 03 | උතුරු පළාත | 05 | 34 | 921 |
| 04 | උතුරු මැද පළාත | 02 | 29 | 989 |
| 05 | වයඹ පළාත | 02 | 46 | 2158 |
| 06 | සබරගමුව | 02 | 28 | 1148 |
| 07 | දකුණු පළාත | 03 | 47 | 2122 |
| 08 | බස්නාහිර පළාත | 03 | 40 | 2495 |
| 09 | ඌව පළාත | 02 | 26 | 886 |
| එකතුව | | 25 | 332 | 14022 |

## ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට නායකත්වය දුන් අමාත්‍යවරුන්

| | |
|---|---|
|  | දොන් බාරොන් ජයතිලක<br>මැතිතුමා<br>1931 සිට 1942 දක්වා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | අරුණාචලම් මහාදේව මැතිතුමා<br>1942 සිට 1946 දක්වා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | ඔලිවර් ගුණතිලක මැතිතුමා<br>1947 සිට 1952 දක්වා<br>රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | ඒ.රත්නායක මැතිතුමා<br>1953 සිට 1956 දක්වා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | ඒ.පී.ජයසූරිය මැතිතුමා<br>1956 සිට 1959 දක්වා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | ආචාර්ය එම්.සී.එම්.කලීල්<br>මැතිතුමා<br>1960 මාර්තු සිට 1960 ජූලි දක්වා<br>ස්වදේශ කටයුතු සහ ග්‍රාමීය යටිතල<br>පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය |
|  | මෛත්‍රීපාල සේනානායක<br>මැතිතුමා<br>1960 සිට 1965 දක්වා<br>කර්මාන්ත, ස්වදේශ කටයුතු සහ<br>සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |

| | |
|---|---|
|  | ආචාර්ය ඩබ්ලිව්.දහනායක මැතිතුමා<br>1965 සිට 1970 දක්වා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | ෆීලික්ස් ඩයස් බණ්ඩාරණායක<br>මැතිතුමා<br>1970 සිට 1974 දක්වා<br>රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | ටී.බී.ඉලංගරත්න මැතිතුමා<br>1974 සිට 1977 දක්වා<br>රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු<br>අමාත්‍යාංශය |
|  | මොන්ටේගු ජයවික්‍රම මැතිතුමා<br>1977 සිට 1980 දක්වා<br>රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු<br>අමාත්‍යාංශය |
|  | කේ.ඩබ්ලිව්.දේවනායගම් මැතිතුමා<br>1980 සිට 1989 දක්වා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | යූ.බී.විජේකෝන් මැතිතුමා<br>1989 සිට 1990 දක්වා<br>රාජ්‍ය පරිපාලන පළාත් සභා හා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | ෆෙස්ටස් පෙරේරා මැතිතුමා<br>1990 සිට 1994 දක්වා<br>රාජ්‍ය පරිපාලන පළාත් සභා හා<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |

| | |
|---|---|
|  | රත්නසිරි වික්‍රමනායක මැතිතුමා<br>1994<br>රාජ්‍ය පරිපාලන පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | අමරසිරි දොඩම්ගොඩ මැතිතුමා<br>1994 සිට 2000 දක්වා<br>ස්වදේශ කටයුතු, පළාත් පාලන හා සමූපකාර අමාත්‍යාංශය |
|  | ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමා<br>2000 සිට 2001 දක්වා<br>රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය /<br>ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය /<br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය |
|  | ඇලික් අළුවිහාරේ මැතිතුමා<br>2001 සිට 2004<br>ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශය |
|  | අමරසිරි දොඩම්ගොඩ මැතිතුමා<br>2004 සිට 2005 දක්වා<br>ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශය |
|  | ආචාර්ය සරත් අමුණුගම මැතිතුමා<br>2005 සිට 2007 දක්වා<br>රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | දේශමාන්‍ය කරු ජයසූරිය මැතිතුමා<br>2007 සිට 2009 දක්වා<br>රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | ආචාර්ය සරත් අමුණුගම මැතිතුමා<br>2009 සිට 2010 දක්වා<br>රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | ජෝන් සෙනවිරත්න මැතිතුමා<br>2010<br>රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | එම්.ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා<br>2015 ජනවාරි සිට 2015 සැප්තැම්බර්<br>ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යාංශය<br>/<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
|  | වජිර අබේවර්ධන මැතිතුමා<br>2015 සැප්තැම්බර් සිට<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |





| ආයතන | මාණ්ඩලික ශ්‍රේණි (ජ්‍යෙෂ්ඨ) | මාණ්ඩලික ශ්‍රේණි (කණිෂ්ඨ) | ප්‍රාථමික සේවා ශ්‍රේණි | කණිෂ්ඨ ශ්‍රේණි | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| ස්වදේශ කටයුතු අමාත්‍යාංශය / දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 533 | 1 | 17,819 | 72 | | 18,425 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 9 | 898 | 960 | 414 | | 2,281 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ | 44 | 24 | 1,068 | 122 | 4 | 1,262 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | 45 | 22 | 1,687 | 106 | | 1,860 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර | 49 | 18 | 1,342 | 158 | | 1,567 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | 65 | 35 | 1,879 | 192 | | 2,171 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ | 41 | 16 | 901 | 110 | 26 | 1,094 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය | 21 | 28 | 677 | 76 | | 802 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | 64 | 25 | 1,702 | 161 | | 1,952 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර | 52 | 27 | 1,434 | 136 | 1 | 1,650 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට | 41 | 13 | 1,037 | 110 | | 1,201 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය | 49 | 20 | 1,002 | 192 | | 1,263 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මන්නාරම | 20 | 01 | 268 | 36 | | 325 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව | 20 | 6 | 224 | 51 | 2 | 303 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මුලතිව් | 19 | 3 | 204 | 39 | 1 | 266 |

| ආයතන | මාණ්ඩලික ශ්‍රේණි (ජ්‍යෙෂ්ඨ) | මාණ්ඩලික ශ්‍රේණි (කණිෂ්ඨ) | ප්‍රාථමික සේවා ශ්‍රේණි | කණිෂ්ඨ ශ්‍රේණි | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිලිනොච්චිය | 18 | 2 | 237 | 54 | | 311 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව | 50 | 11 | 811 | 128 | 10 | 1,01 0 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | 60 | 10 | 1,080 | 237 | | 1,387 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය | 34 | 13 | 479 | 113 | | 639 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 99 | 38 | 2,737 | 285 | | 3,159 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම | 51 | 17 | 985 | 159 | | 1,212 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය | 68 | 23 | 1,212 | 198 | | 1,501 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව | 26 | 10 | 523 | 83 | | 642 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල | 44 | 28 | 1,013 | 138 | | 1,223 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල | 36 | 6 | 681 | 98 | | 821 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | 55 | 27 | 1,145 | 176 | 1 | 1,404 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | 40 | 16 | 996 | 111 | | 1,163 |
| | 1,653 | 1,338 | 44,103 | 3,755 | 45 | 50,894 |

## පාලන අංශය

### පාලන අංශයේ කාර්යයන්

- ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර පරිපාලන ව්‍යුහයට අයත් නිළධාරින්ගේ සියලුම ආයතනික කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයේ ගුණාත්මකභාවය ඉහළ නැංවිය හැකි භෞතික පරිසරයක් නිර්මාණය කිරීම හා පවත්වා ගෙන යාම.
- කාර්යය මණ්ඩල සමාලෝචනය කිරීම, යාවත්කාලීන කර පවත්වාගෙන යාම හා කාර්ය මණ්ඩල සුභසාධනය ඉහල මට්ටමකට ගෙන ඒම.
- ආරක්ෂාව හා සනීපාරක්ෂාව අඛණ්ඩව හා ඵලදායි ලෙස සපයා ගැනීම හා පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයේ ස්ථාපිත ගොඩනැගිලිවල නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු පරිපාලනය කිරීම හා ප්‍රවාහන, විදුලි, ජල සැපයුම, දුරකථන වැනි සේවා පහසුකම් නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම.
- මානව සම්පත් සංවර්ධනයට අදාලව දෙස් විදෙස් පුහුණු අවශ්‍යතා හඳුනාගෙන එම පුහුණු වැඩ සටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම.
- අමාත්‍යාංශයේ වාහන අලුත්වැඩියාව, නඩත්තු කටයුතු, නව මිළදී ගැනීම් සහ අපහරණය කිරීම.
- අභ්‍යන්තර හා බාහිර ආයතන සමඟ ඉහළ සම්බන්ධීකරණයක් ඇති කිරීම හා පවත්වා ගෙන යාම.
- තොරතුරු තාක්ෂණය උපයෝගි කර ගනිමින් කාර්යාල ක්‍රම කාර්යක්ෂම සහ විධිමත් කිරීම.
- ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් කාර්යාල ජාල ගත කිරීම් සහ දත්ත ගබඩාවන් පරිපාලනය.

## මූල්‍ය අංශය

මූල්‍ය ක්‍රියාකාරකම් කාර්යක්ෂමව හා ඵලදායීව නවීන තාක්ෂණ ශිල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ග්‍රාමීය පරිපාලනය ශක්තිමත් කර දීමේදී ප්‍රධාන අංශයක් ලෙස මූල්‍ය අංශය හැඳින්විය හැක. මූල්‍ය අංශය උප අංශ පහකින් සමන්විත වන අතර, දිස්ත්‍රික් ගිණුම්, මූල්‍ය වාර්තාකරණ, වැටුප් හා ගෙවීම්, ප්‍රසම්පාදන සහ ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන එම අංශ වේ. නිශ්චිතව පවරා දෙනු ලබන විෂය පථයට අදාලව මුදල් රෙගුලාසි හා ඒ හා සම්බන්ධ සියලු නීතිරීති හා විධිවිධානයන්ට අනුකූල වන පරිදි ආයතනයේ ගිණුම්කරණ පද්ධතිය විධිමත්ව පවත්වාගෙන යාම, තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාල වන්නාවූ තොරතුරු වාර්තාකරණය හා ඒ සඳහා අදාල වන්නා වූ ගිණුම්කරණ හා ඊට අදාල තොරතුරු වාර්තා සකස් කිරීම හා ඒවා යාවත්කාලීනව පවත්වාගෙන යාම, ලැබීම්, ගෙවීම් සම්බන්ධ කටයුතු ඉටුකිරීම, ඇස්තමේන්තු සකස් කිරීම, විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම, ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට සහායවීම, අනුබද්ධ ආයතනවල ගිණුම් කටයුතු හා සම්බන්ධව පවරා දෙනු ලබන කාර්යයන් හා ආයතනයේ ගිණුම්කරණ ක්‍රියාවලියට අදාල වෙනත් කාර්යයන් වන කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, මූල්‍ය උපදෙස් හා මඟ පෙන්වීම, මූල්‍ය සැලසුම්කරණය හා අයවැය, ගිණුම්කරණය හා වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, වත්කම් කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, විදේශ ආධාර ව්‍යාපෘති සම්බන්ධ මූල්‍ය කළමනාකරණ උපදෙස් හා සුපරීක්ෂණය, මූල්‍ය ප්‍රතිපත්ති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම හා මූල්‍ය වගකීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාට හා මූල්‍ය කටයුතු වලට අදාලව පාර්ලිමේන්තුවට වගකිව යුතු කරුණු සඳහා සහාය වීම, අනුබද්ධ ආයතනවල මූල්‍ය කළමනාකරණය සඳහා මඟ පෙන්වීම, සුපරීක්ෂණය හා උපදෙස් ලබාදීම හා මූල්‍ය කළමනාකරණ කාර්ය මණ්ඩල පුහුණුව යනාදිය අන්තර්ගත වේ.



අමාත්‍යාංශයේ නිලධාරින් සඳහා පුහුණුවීම් ලබාදුන් අවස්ථාවක්



වර්ෂ අවසාන ගිණුම් පියවීමේ කටයුතු

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල මානව සම්පත් කළමනාකරණය සහ අධීක්ෂණය.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල කළමනාකරණය.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි ගැටළු කළමනාකරණය.
- ජාතික සහ රාජ්‍ය උත්සව සංවිධානය කිරීම.
- ජාතික ගීය, ජාතික කොඩිය සම්බන්ධව කටයුතු කිරීම සහ රජයේ නිවාඩු දින තීරණය කිරීම.
- ශ්‍රී ලංකා ජනරජ ප්‍රමුඛතා ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාම.

## දිස්ත්‍රික් පාලන අංශය විසින් 2016 වසර තුල සිදු කල විශේෂ කාර්යයන්

- **දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරුන්ගේ සම්මන්ත්‍රණය**

දිස්ත්‍රික් මට්ටමින් පවතින පොදු ගැටළු පිළිබඳව සාකච්ඡා කර විසඳුම් ලබා දීම සඳහා මෙන්ම වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා අවස්ථාව ලබා දීම සඳහා දිස්ත්‍රික් ලේකම් සමුළු පවත්වනු ලබයි. 2016 වසර තුල දිසාපති සමුළු 06ක් සාර්ථක ලෙස පවත්වන ලදි.



- **68 වන නිදහස් සමරු උළෙල**

"එකම දැයක් මහ බලයක්" යන්න තේමා කරගනිමින් 68 වන ජාතික නිදහස් දින උළෙල අභිමානවත් අයුරින් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.02.04 දින පෙරවරුවේ ගාලු මුවදොර පිටියේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විය.



- **අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම අනුනායක ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය**

ජාතික ආගමික හා ශාසනික වශයෙන් ශ්‍රී ලංකාවට උදාර සේවයක් කල අපවත් වී වදාල ශ්‍රී ලංකා රාමඤ්ඤ මහ නිකායේ අනුනායක ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා ප්‍රධාන අනුශාසක මහා කම්මට්ඨානාචාර්ය මහෝපාධ්‍යාය ත්‍රිපිටකාචාර්ය අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම අනුනායක ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය 2016.09.12 දින රාජ්‍ය අනුග්‍රහය සහිතව පාර්ලිමේන්තු ක්‍රීඩාංගනයේදී පැවැත්විය.



## දිස්ත්‍රික් පාලන අංශය

- **ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී.අමරදේව ශූරීන්ගේ ආදාහන උත්සවය**

ශ්‍රී ලාංකික කලා කෙතට කළ උදාර සේවය වෙනුවෙන් ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී.අමරදේව ශූරීන්ගේ අවමංගල්‍ය උත්සවය රාජ්‍ය අනුග්‍රහයෙන් පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව නිදහස් චතුරශ්‍රයේදී 2016.11.05 වන දින පැවැත්විය.



- **සංවර්ධන නිලධාරීන් සඳහා රාජකාරි ලයිස්තුවක් සකස් කිරීම**

පසුගිය වසරේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සේවය කල සියලුම සංවර්ධන නිලධාරීන් මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරනු ලැබූ අතර ඔවුන්ගේ ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනාගත් නිශ්චිත රාජකාරි පැවරීමක් සිදු නොකිරීම යන ගැටළුව සඳහා විසඳුමක් ලබා දීමට ඔවුන් සඳහා පොදු රාජකාරි ලයිස්තුවක් මෙම අංශය විසින් සකස් කර ඇත.

- **ත්‍රිවිධ හමුදා සේවයේ නිරත වූ විශ්‍රාමික කාර්මික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම**

කාර්මික නිලධාරි තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වන විසඳුමක් ලෙස, බඳවා ගැනීම් පටිපාටිය අනුව සුදුසුකම් සපුරා ඇති ත්‍රිවිධ හමුදා සේවයේ නිරත වූ විශ්‍රාමික කාර්මික නිලධාරීන් 19 දෙනෙකු මෙම අමාත්‍යාංශයට බඳවා ගැනීම තුලින් සංවර්ධන කටයුතු තවත් ශක්තිමත් කිරීමට මෙම අංශය සමත් විය.

## සංවර්ධන අංශය

- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම් වලට අදාල කටයුතු කළමනාකරණය.



පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මුල් ගල තැබීම



මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මුල් ගල තැබීම

- ව්‍යාපෘති වාර්තා අධීක්ෂණය, මග පෙන්වීම. ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කිරීම.
- වාර්ෂික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගතිය පසුවිපරම් කිරීම.
- ගොඩනැගිලි ඉදිකිරීම් වලට අදාල ප්‍රසම්පාදන කළමනාකරණය.
- මූලධන ව්‍යාපෘති වලට අදාල රාජ්‍ය ආයෝජන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සේවා පියස ඉදිකිරීම් කළමනාකරණය.

## ප්‍රධාන ක්‍රියාකාරකම්



- ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ කටයුතු සම්බන්ධීකරණය හා ඒ සඳහා මඟ පෙන්වීම.
- ප්‍රාදේශිය ලේකම්වරුන් හා සහකාර ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ පත්වීම් හා ස්ථානමාරු.
- ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල ගොඩනැගලි ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය.
- ප්‍රාදේශිය ලේකම් කාර්යාල අධීක්ෂණය කිරීම.
- ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලය සඳහා වඩා යහපත් කළමනාකරණ පද්ධතීන් හඳුන්වා දීම හා පවතින පද්ධතීන් හා පටිපාටීන් සංශෝධනය කිරීම.
- ප්‍රාදේශිය ලේකම් කාර්යාල අතර කළමනාකරණ තරඟ පැවැත්වීම.



- ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා අනෙකුත් අමාත්‍යාංශ විසින් සිදුකරනු ලබන කටයුතු සම්බන්ධීකරණය.
- ස්වදේශ කටයුතු අංශය යටතේ ක්‍රියාත්මක සංචාරක නිවාස රජයේ සේවකයන් සඳහා වෙන් කිරීම හා එම සංචාරක නිවාස කළමනාකරණයට අදාළ කටයුතු.
- ප්‍රාදේශිය පරිපාලන කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා පියවර ගැනීම.

## නෛතික රාමුව

ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ බලතල වල කේන්ද්‍රිය මූලාශ්‍රය වනුයේ 1992 අංක 58 දරණ බලතල පැවරීමේ (ප්‍රාදේශිය ලේකම්වරු) පනතයි.



## ප්‍රාදේශිය ලේකම් කාර්යාල

ප්‍රාදේශිය පාලන අංශයට අයත් වන ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගණන 313 ක්ද, උප දිසාපති කාර්යාල ගණන 16 ක්ද, උප කාර්යාල ගණන 3 ක් ද වේ.

ග්‍රාම නිලධාරි පාලන අංශය, රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව ග්‍රාමීය මට්ටමේ පරිපාලන ක්‍රමයක් සහතික කරනු වස්, දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332 ට අදාල ග්‍රාම නිලධාරි වසම් 14022 තුල රාජකාරි ඉටුකරන ග්‍රාම නිලධාරීන් සම්බන්ධ සමස්ථ පරිපාලන කටයුතු මෙහෙයවනු ලබයි.

### ග්‍රාම නිලධාරි පාලන අංශයේ කාර්යභාරයන්

- නව ග්‍රාම නිලධාරීන් බඳවාගැනීම හා සම්බන්ධ කටයුතු.
- ග්‍රාම නිලධාරීන් සඳහා උසස්වීම ලබාදීම.
- පරිපාලන ග්‍රාම නිලධාරීන් පත්කිරීම.
- ග්‍රාම නිලධාරි පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම.
- ග්‍රාම නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාල කටයුතු.
- ග්‍රාම නිලධාරී විනය සම්බන්ධ කටයුතු.
- ග්‍රාම නිලධාරීන්ට එරෙහිව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ග්‍රාම නිලධාරීන්ට සේවා පහසුකම් සැපයීම.
- ග්‍රාම නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධ කටයුතු.
- ග්‍රාම නිලධාරීන් විශ්‍රාම ගැන්වීම සම්බන්ධ කටයුතු.
- විශ්‍රාමික ග්‍රාම නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීම.
- ග්‍රාම නිලධාරීන් විදේශ සංචාර සඳහා සහභාගි කරවීමට අදාල කටයුතු යෙදීම.
- ග්‍රාම නිලධාරි දත්ත පද්ධති පවත්වාගෙන යාම.
- ස්වදේශ කටයුතු අංශයට අයත් සංචාරක නිවාස වෙන්කිරීම හා ඊට අදාල ආයතන කටයුතු.

### සංචාරක නිවාස

ස්වදේශ කටයුතු අංශයට අයත් සංචාරක නිවාස ගණන 29 යි. එම සංචාරක නිවාස පහත දැක්වෙන ස්ථාන වල පිහිටා ඇත.

| | | | |
|---|---|---|---|
| 1 | ගාල්ල (බටගන්විල) | 16 | මොණරාගල |
| 2 | මහනුවර | 17 | ත්‍රිකුණාමලය |
| 3 | මාතර | 18 | අම්පාර |
| 4 | හම්බන්තොට | 19 | මුලතිව් |
| 5 | කතරගම | 20 | හලාවත |
| 6 | බදුල්ල | 21 | ආරුගම්බේ |
| 7 | නුවරඑළිය | 22 | මඩු |
| 8 | අනුරාධපුර | 23 | පොළොන්නරුව - නව |
| 9 | පොළොන්නරුව | 24 | ත්‍රිකුණාමලය - නව |
| 10 | කුරුණෑගල | 25 | මන්නාරම |
| 11 | පුත්තලම | 26 | තවලම |
| 12 | යාපනය | 27 | රත්නපුරය |
| 13 | මාතලේ | 28 | දෙනියාය |
| 14 | මඩකලපුව - 1 | 29 | වාකරේ |
| 15 | මඩකලපුව - 2 | | |



අනුරාධපුර සංචාරක නිවාසය

## විමර්ශන අංශය

- මහජන පැමිණිලි කළමනාකරණය.
- ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ග්‍රාම නිලධාරි පරිපාලන විමර්ශන කටයුතු කළමනාකරණය.
- වංචා, දූෂණ සහ අක්‍රමිකතා ක්‍රම හඳුනාගැනීමට සහ වලක්වා ගැනීමට නව ක්‍රම හඳුන්වාදීම.
- විනය පරීක්ෂණ වලට අදාල කටයුතු කළමනාකරණය.

## අභ්‍යන්තර විගණන අංශය

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි විගණන කටයුතු සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වගකීම් දරයි.




# දිස්ත්‍රික්ක වලට අදාල තොරතුරු



බස්නාහිර පළාතේ ප්‍රධානතම දිස්ත්‍රික්කයක් වන කොළඹ දිස්ත්‍රික්කය වර්ග කි.මී. 675 කින් යුක්තය. මෙහි මායිම් වශයෙන් උතුරින් කැළණි ගඟද, දකුණෙන් පානදුර බොල්ගොඩ ගඟද, බස්නාහිරින් මුහුදු තීරයද, නැගෙනහිරින් සබරගමු පළාත් මායිම්ද සීමා මායිම් කොට ගෙන පිහිටා ඇත. ලංකාවේ අගනුවර පිහිටි දිස්ත්‍රික්කය වන මෙහි ජනගහනය 2,309,199 ක් වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13කින් සමන්විත වේ. රාජ්‍ය අමාත්‍යාංශ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් මෙහෙය වීම කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වන අතර බස්නාහිර පළාත් සභාව සමගද සෘජු සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමද ඒ අතර ප්‍රධාන වේ. විශේෂයෙන්ම දිස්ත්‍රික්කයේ ආර්ථික සංවර්ධන කටයුතු මෙන්ම ආර්ථික, සමාජ, සංස්කෘතික හා සුබසාධන කටයුතු ද අමාත්‍යාංශ වලින් ලැබෙන ප්‍රතිපාදන ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබන අතර එමඟින් ජනතාවගේ ජීවන තත්වය ඵලදායී ලෙස නංවාලීම දැනට ක්‍රියාත්මක කොළඹ දිස්ත්‍රික් සංයුක්ත සැලැස්මේද ප්‍රධාන අරමුණ බවට පත්කර ඇත. කොළඹ දිස්ත්‍රික්කය මැතිවරණ කොට්ඨාශ 13කින් සහ පලාත් පාලන ආයතන 13 කින් සමන්විතය.






ස්වදේශ කටයුතු අමාත්‍යාශය ඉදිකිරීම රු.මි. 3461 ක ප්‍රතිපාදන භාවිතා කරමින් කඩිනමින් ඉදි වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය 2018 ජනවාරි මස අවසන් කිරීමට යෝජිතව ඇත

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 2,309,199 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 1,649,716 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 13 |
| ග්‍රාම සේවා වසම් ගණන | 557 |









| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 2,354,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 1,681,887 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 13 |
| ග්‍රාම සේවා වසම් ගණන | 1,177 |

ගම්පහ දිස්ත්‍රික්කය පරිපාලන දිස්ත්‍රික් පනතේ 3 වන ඡේදය යටතේ 1978 සැප්තැම්බර් මස 07 වන දින ගැසට් නිවේදනය මඟින් නව දිස්ත්‍රික්කයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබුණි. මෙය කොළඹ දිස්ත්‍රික්කය නැවත බෙදීමෙන් වෙන් කරන ලද පාලන ප්‍රදේශයකි. ගම්පහ බැන්ඩියමුල්ල ප්‍රදේශයේ අග්‍රා ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූලස්ථානය කේන්ද්‍රකර ගත් උතුරින් මා ඔයෙන්ද (කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක) නැගෙනහිරින් මීටර් 100-200 උසකින්ද විහිදී යන වැටි හා නිම්න වලින්ද (කෑගල්ල දිස්ත්‍රික්කය) දකුණින් කැළණි ගඟ මායිම් වන කොළඹ දිස්ත්‍රික්කයෙන්ද, බටහිර ඉන්දියන් සාගරයෙන්ද, මායිම් වූ කිලෝ මීටර 45 දිගින් හා පළලින් යුත් හතරැස් බිම් කඩක් වශයෙන් පිහිටා ඇත. සංස්කෘතික, දේශපාලන හා අධ්‍යාපනික ක්ෂේත්‍රයන්හි ගම්පහ දිස්ත්‍රික්කයට අද්විතීය ස්ථානයක් හිමි වෙයි. දිවයිනේ අග නගරය හා ජාත්‍යන්තර වරායට මුවදොර පිහිටි ගම්පහ දිස්ත්‍රික්කය නිෂ්පාදන කර්මාන්ත කේන්ද්‍ර කරගත් නිදහස් වෙළඳ කලාප, සංචාරක ව්‍යාපාරය සම්බන්ධවද ජාත්‍යන්තර ගුවන් තොටුපල, දුම්රිය හා මහා මාර්ග මෙන්ම විදුලි බලය හා දුරකථන වැනි යටිතල පහසුකම් අතින්ද විශේෂ වැදගත් කමක් උසුලයි. ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර 1,387 (හෙක්ටයාර 139,140) භූමි ප්‍රමාණයකින් යුක්ත වන අතර කොළඹ දිස්ත්‍රික්කය මෙන් දෙගුණයක් විශාලත්වයක් දරයි. බස්නාහිර පළාතේ මුළු බිම් ප්‍රමාණයෙන් 38% හා ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 2.1% ආවරණය වේ. උතුරු අක්ෂාංශ 6 54″5 සහ 7 20 අතර හා නැගෙනහිර දේශාංශ 79 48.75 සහ 80 13 අතර පිහිටා ඇත. ගම්පහ දිස්ත්‍රික්කය 21.6C අවම උෂ්ණත්වයකින්ද 37C උපරිම උෂ්ණත්වයකින්ද මිලි මීටර් 1,750 පමණවූ සාමාන්‍ය වර්ෂාපතනයකින්ද (හෙනරත්ගොඩ 2,477 මිලි මීටර්) යුතු උෂ්ණ තෙත් කලාපීය දේශගුණයක් විදහාපාන භූමි ප්‍රදේශයකි.වැසි ලැබෙන්නේ අන්තර් මෝසම් සුළඟ සහිත කාල පරිච්ඡේදයේ හා නිරිත දිග මෝසම් සුළං කාලයේදීය.





බස්නාහිර පළාතේ පිහිටි කළුතර දිස්ත්‍රික්කයේ සාපේක්ෂ පිහිටීම සලකන විට උතුරින් කොළඹ දිස්ත්‍රික්කයටත්, නැගෙනහිරින් රත්නපුර දිස්ත්‍රික්කයටත්, දකුණින් ගාල්ල දිස්ත්‍රික්කයටත්, බටහිරින් සාගරයටත් මායිම් වේ. එහි නිරපේක්ෂ පිහිටීම දළ වශයන් උතුරු අක්ෂාංශ $6^{0}$ $19^{1}$ $30^{11}$ – $6^{0}$ $49^{1}$ $30^{11}$ සහ නැගෙනහිර දේශාංශ $79^{0}$ $51^{1}$ $30^{11}$ – $80^{0}$ $22^{1}$ $45^{11}$ වශයෙන් දැක්විය හැකිය. කෝරළ දෙකකින් , පත්තු අටකින් හා තොටමුණු දෙකකින් යුත් කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර සීමාව මධ්‍යම කඳුකරයෙන් පහත් වී එන කඳුවැටියට සම්බන්ධ වූ කඳුගැට කිහිපයකින් හා රැලි සහිත බිමෙන් යුතු වේ. මධ්‍යම කොටස හා බටහිර සීමාව වැඩි වශයෙන් තැනි බිම් සහිත වේ. නැගෙනහිර සීමාවෙන් ඇරඹෙන කළුගඟ හා බෙන්තර ගඟත් , අතු ගංඟා වන හික් ගඟ හා කුඩා ගඟත් මාවක් ඔයත් ප්‍රධාන වශයෙන් ජල ප්‍රවාහන රටා නිර්ණය කරයි. දිස්ත්‍රික්කයේ භූමි පරිහරණයෙන් වැඩි කොටසක ව්‍යාප්තව පැවති රබර් වගාවේ පරිහානියත් සමඟ දිස්ත්‍රික්කයේ කඳු සහිත කොටසට සීමා වී පැවති තේ වගාව දිස්ත්‍රික්කය පුරා වර්ධනය වීමක් සිදුවෙමින් පවතී. මීට අමතරව පොල්, කුරුඳු ගම්මිරිස් වැනි අපනයන බෝග වගාවන් මධ්‍ය කොටස්වල වේ. තැනිතලා සහ පහත් බිම් වල වී වගාව ව්‍යාප්තව ඇති අතර දිස්ත්‍රික්කයේ ගිණිකොණ දෙසින් පිහිටි සිංහරාජ වනය වනාන්තර ලක්ෂණ පිළිබිඹු කරයි. ඓතිහාසික අගයන් ඔපවත් කරන නටඹුන් අතර බුලත්සිංහල, පාහියංගල, පිහිටි ලෙන බලංගොඩ මානවයාගේ කාලීනයන් විසූ බවට කැනීම් තුලින් සාධක ලබා ගෙන ඇත. දෙවන පැතිස් රජ දවස රෝපණය කරන ලද තිස් දෙකක් වූ බෝ පැලවලින් එකක් ලෙසට කළුතර බෝධිය හා චෛත්‍යය ශ්‍රී ලාංකික බෞද්ධ, අබෞද්ධ බැතිමතුන්ගේ මෙන්ම විදේශ සංචාරකයින්ගේ ද භක්ත්‍යාදරයට පත් ඉපැරණි සිද්ධස්ථානයකි




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 1,261,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 930,901 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 14 |
| ග්‍රාම සේවා වසම් ගණන | 762 |





මධ්‍යම පළාතේ ප්‍රධානතම දිස්ත්‍රික්කය වන මහනුවර දිස්ත්‍රික්කය උතුරට මාතලේ දිස්ත්‍රික්කයෙන් ද නැගෙනහිරට බදුල්ල දිස්ත්‍රික්කයෙන් ද දකුණට නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ද බස්නාහිරට කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ද මායිම්ව පිහිටා ඇත. දිස්ත්‍රික්කයට සම්පතක් වී ඇති සමනළ අඩවියේ උපන් මහවැලි නදිය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඔස්සේ ගඟවට කෝරලේ, කුණ්ඩසාලේ උඩ පළාත, දොළුව, උඩුනුවර, යටිනුවර, හාරිස්පත්තුව, කුණ්ඩසාලේ හා මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා ගලා බැස පසුව දිස්ත්‍රික්ක මායිමෙන් ගලා ගොස් මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා බදුල්ල දිස්ත්‍රික්කයට වැටේ. ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 ක්ද ප්‍රාදේශීය සභා 17 ක්ද ග්‍රාම නිලධාරී කොට්ඨාස 1188 කින්ද සමන්විත වේ.මනහර කඳුවැටි හා නිම්න භූමි වලින් සැඳුම්ලත් මහනුවර දිස්ත්‍රික්කය මධ්‍යම කඳුකරයේ වර්ග කිලෝමීටර් 1940 ක භූමි ප්‍රමාණයක් වසා පැතිරී ඇති මනරම් භූමි භාගයකි.  මහවැලි ගංඟාවට දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ වලින් ගලා එන ජල ධාරාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් එක්  වේ. මීට අමතරව දැදුරු ඔයේ ආරම්භක ජල ධාරා ආරම්භවන්නේ ද පූජාපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙනි. දිස්ත්‍රික්කයේ යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල බටහිර බෑවුමෙන් ගලා යන ජලධාරා මා ඔයට එක් වී එහි ජලධාරාව වැඩි කරයි.




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 1,416,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 1,086,161 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 20 |
| ග්‍රාම සේවා වසම් ගණන | 1,188 |





ශ්‍රී ලංකාවේ මධ්‍ය ප්‍රදේශය ලෙස සැලකෙන මාතලේ දිස්ත්‍රික්කය විශාලත්වයෙන් ව. කි.මි. 1993.3 කින් සමන්විත වේ. මධ්‍යම පළාතේ උතුරු කොටස නියෝජනය කෙරෙන මාතලේ දිස්ත්‍රික්කයට උතුරෙන් අනුරාධපුරය ද නැගෙනහිරින් පොළොන්නරුව, බදුල්ල හා අම්පාර ද දකුණින් මහනුවර ද බටහිරින් කුරුණෑගල ද යන දිස්ත්‍රික්ක මායිම් වේ. දිවයිනේ ස්වභාවික සම්පත් වලින් අනූන ප්‍රදේශ වලින් එකකි. ලොව අති විශිෂ්ට නිර්මාණයක් වූ සීගිරිය ද සොබා දහමේ අපූර්වතම දායාදයක් වන නකල්ස් කඳු වැටිය ද පිහිටි මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක් පුරා විහිදුනු ගම්මාන 1373 කින් සමන්විත ලක්ෂ 05 කට අධික ජනගහනයක් වෙසෙන ප්‍රදේශයකි. කඳුකර පද්ධතියට අයත් කොට්සයිට්ල පියුම් බන්ඩිත නයිස්, ග්‍රනයිට්, කැලික්නයිස්, ස්ඵටික හුණුගල් ඩොලයිට් හා කොණ්ඩලයිට් වර්ගයට අයත් ගානට්, සිලමනයිට්, ෂිස්ට් හා ග්‍රැපයිට් යන පාෂාණ වලින් මාතලේ දිස්ත්‍රික්කය සමන්විත වේ. දිස්ත්‍රික්කයේ වනාන්තර ව්‍යාප්තිය ද සංකීර්ණය. එහි මධ්‍ය නිරිත හා බටහිර ප්‍රදේශ කඳුකර තෙත් කලාපීය වනාන්තර ද උතුරු හා ලග්ගල - විල්ගමුව ප්‍රදේශ පහතරට වියළි කලාපීය වනාන්තර වලින්ද සමන්විත වේ.ප්‍රධාන මෝසම් සුළං වර්ෂා 2 මඟින්ම වර්ෂාව ලැබුවත් වැඩි වර්ෂාපතනයක් ලැබෙන්නේ ඊසාන දිග මෝසම් සුළං මඟිනි. නකල්ස් කඳු වැටිය අසල පුළුල් ජෛව විවිධත්වයක් පෙන්නුම් කරන අතර මෙය ලංකාවේ ප්‍රධාන දායාදයක් ලෙස සැලකිය හැකිය. හෝටන් තැන්නට බොහෝ සෙයින් සමාන එහෙත් විශාල නොමැති පතනයක් පිටවල ආශ්‍රිතව පිහිටා ඇති අතර කුඩා ලෝකාන්තයද එහි එක් කෙලවරක පිහිටා ඇත.







මාතලේ නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලට මුල් ගල තැබීම

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 508,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 391,892 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 11 |
| ග්‍රාම සේවා වසම් ගණන | 545 |

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ මාතලේ නව පරිපාලන සංකීර්ණය ගොඩ නැඟීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රු.මි. 400 ක ප්‍රතිපාදන වෙන්කර ඇත.







| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 740,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 548,971 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 05 |
| ග්‍රාම සේවා වසම් ගණන | 491 |

ශ්‍රී ලංකාවේ පියස්ස යැයි විරුදාවලි ලබන නුවරඑළිය දිස්ත්‍රික්කය මහනුවර, බදුල්ල, කෑගල්ල හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්ට මායිම්ව, මධ්‍යම පලාතේ පිහිටා ඇත. මුහුදු මට්ටමේ සිට අඩි 900 සිට අඩි 8000 දක්වා උසට විහිදී යන ශ්‍රී ලංකාවේ උසම කන්ද වන පිදුරුතලාගල කන්ද මෙන්ම කිරිගල් පොත්ත කන්ද, කොටුපොල කන්ද කිකිළියාමාන කන්ද, ග්‍රේඩ් වෙස්ටන් කන්ද ,හග්ගල කන්ද හා අති පූජණීය සමනල කන්ද ආදී කඳු පන්තිද නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත. එසේම ලක්ෂපාන ඇල්ල, ඩෙවෝන් ඇල්ල, ඇල්ජින් ඇල්ල, සෙන්ට් ක්ලේයා ඇල්ල, රම්බොඩ ඇල්ල, බේකස් ඇල්ල, කුරුඳු ඇල්ල, ගැරඩි ඇල්ල ආදියත් මහවැලි හා කැළණි ගංගාවල ආරම්භයත් එසේම දෙස් විදෙස් ප්‍රචලිත හෝර්ටන් තැන්න අභය භූමියත්, හග්ගල උද්‍යානයත් මෙහි පිහිටා තිබීම සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට හේතුවී තිබේ. එසේම ශ්‍රී ලංකාවේ ජලවිදුලි බල උත්පාදනයට ප්‍රමුඛත්වයක් ගන්නා මාවුස්සා කැලේ, කාසල්රී, කැනියොන්, නෝර්ටන්බ්‍රිජ්, කොත්මලේ, රන්දෙණිගල යන ජලාශද, වික්ටෝරියා ජලාශයෙන් වැඩි කොටසක්ද පිහිටා ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළය. ජනගහනයෙන් 57.1% ක් පමණ ශ්‍රී ලංකා දෙමළ වන අතර, ඉතිරිය සිංහල හා අනෙකුත් ජාතීන්ගෙන් සමන්විත වේ. වර්ග කිලෝ මීටර් 1741 ක විශාලත්වයකින් යුක්ත මෙම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වර්ෂාපතනය අඟල් 75 ක් පමණ වන අතර, ලංකාවේ වැඩිම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශය (වටවල) මෙන්ම අවම උෂ්ණත්වය වාර්තා වන ප්‍රදේශයද (නුවරඑළිය) මෙම දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබීම විශේෂත්වයකි. දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත, කොත්මලේ, වලපනේ වැනි ප්‍රදේශ හෙළ රජවරුන්ගේ ආරක්ෂක භූමි ලෙස පැවති අතර, එකල ඉදිවූ රජ මහා විහාර ආදිය මේ දක්වා සුරක්ෂිතව පවතී, මෙහි ඉතිහාසය රාවණා යුගය දක්වා දුරාතීතයට පැතිර යන බවට ජනප්‍රවාද මෙන්ම ඉතිහාස වාර්තාද සාක්ෂි දරයි. ඉහත කී ලක්ෂණ වලින් හෙබි නුවරඑළිය දිස්ත්‍රික්කය අඹගමුව, නුවරඑළිය, හඟුරන්කෙත, කොත්මලේ හා වලපනේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහකින් සමන්විතවේ.






| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 1,102,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 843,470 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 19 |
| ග්‍රාම සේවා වසම් ගණන | 896 |

ගාල්ල යනු ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පිහිටි අගනගරයයි. එය වර්ග සැතපුම් 6.5 ක් පුරා පැතිර පවතී. එය යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම නගරයක් ලෙස ද නම් කර ඇත. ගාල්ල පුරාණයේ සිටම වෙළඳ නගරයක් ලෙස ප්‍රසිද්ධව පවතී. ගාලු වරාය, ඉන්දියන් සාගරය තුළ එහි පිහිටීම නිසාම සුවිශේෂී වරායක් ලෙස ප්‍රසිද්ධව ඇති අතර ඇතැම් විද්වතුන්ගේ මතය වන්නේ පැරණි බයිබලයේ සඳහන් දකුණු ආසියාවේ මහා වෙළඳ නගරය වන ටර්ෂිෂ්, ගාල්ල විය හැකි බවයි.

සලමොන් රජ ඇත් දළ, මොණරුන් හා වෙනත් වටිනා භාන්ඩ ගෙන්වා ගත් ඓතිහාසික ටර්ෂිෂ් වරාය ගාලු වරාය බව ජේම්ස් එමර්සන් ටෙන්නෙන්ට් පෙන්වා දෙයි. ක්‍රි.පූ 1400 ටත් පෙර සිට ශ්‍රී ලංකවේ සිට විදේශයන් වෙත කුරුඳු අපනයනය කර ඇති අතර එම අපනයනයන් සඳහා ප්‍රධාන වෙළඳ අන්තර් මධ්‍යස්ථානය ලෙස ගාලු වරාය භාවිත කර ඇත. බටහිර ජාතිකයන් ලංකාවට යටත් කර ගනීමටත් පෙර සිටම ගාල්ල වරාය රටෙහි ප්‍රධාන වරාය ලෙස භවිතා කර ඇත. පර්සියානු ජාතිකයන්, අරාබි ජාතිකයන්, ග්‍රීක ජාතිකයන්, රෝම ජාතිකයන්, මැලේ ජාතිකයන්, ඉන්දීය ජාතිකයන්, චීන ජාතිකයන් ගාල්ල වරාය හරහා ව්‍යාපාරික කටයුතු කරන ලදී. ක්‍රි.ව 1411 දී චීන ජාතික අද්මිරාල් කෙනෙකු වන ෂැන් හේ ගේ ශ්‍රී ලංකාවෙහි දෙවන සංචාරය නිමිත්තෙන් චීන, දෙමළ සහ පර්සියානු භාෂා තුනෙන්ම ගල් පුවරුවක කොටා ඇති ගාල්ල ත්‍රෛභාෂික ලේඛනය සාදන ලදි. ලොරෙන්සො ද අල්මේදා ප්‍රමුඛ පෘතුගීසි නාවික කණ්ඩායමක් ක්‍රි.ව 1502 දී ගාල්ල වරායට පැමිණීමත් සමග ගාල්ල "නූතන" ඉතිහාසය ආරම්භ විය. 1640 දී පෘතුගීසි, ලන්දේසි පෙරදිග ඉන්දියානු සමාගම යටත් විය. "හිරු", "සඳ" සහ "තරු" ලෙස හඳුන්වන ප්‍රාකාර තුනක් සහිත ඝන කළුගල් යොදාගෙන ඉදි කර ඇති වර්තමාන ගාලු කොටු පවුර 1663 වසරේ දී ලන්දේසින් විසින් ඉදිකරන ලදි. 1796 දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් යටත් කර ගත් පසු ඔවුන් ගාලු කොටුව නොවෙනස් කර දිස්ත්‍රික් පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස භාවිත කරන ලදි.



හික්කඩුව නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලට මුල් ගල තැබීම





වැලිවිටිය දිවිතුර නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලට මුල් ගල තැබීම





තවලම නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලට මුල් ගල තැබීම







දකුණුලක නිල්වලා නදිය අසබඩ මහ සයුරට මායිම්ව පිහිටි මාතර දිස්ත්‍රික්කය, රෝහණ පුරවරයේ ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට මැදිව පිහිටා ඇති වර්ග කිලෝමීටර් 1282.5ක් හෙවත් හෙක්ටයාර් 128,250ක භූමි ප්‍රමාණයක වපසරියකින් යුක්ත සශ්‍රීක වූ ආකර්ශනීය භූමි ප්‍රදේශයකි. උතුරු අක්ෂාංශ අංශක 5.8 ත් 6.4 ත් අතර නැගෙනහිර දේශාංශ 80.4ත් 80.7ත් අතර පිහිටි මාතර දිස්ත්‍රික්කය මිලි ලීටර් 2553.2ක සාමාන්‍ය වර්ෂාපතනයකින් ද සෙල්සියස් අංශක 26.7 ක සාමාන්‍ය උෂ්නත්වයකින් ද යුක්ත තෙත් කලාපීය දේශගුණයක් සහිත දිස්ත්‍රික්කයකි. ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 1.93%ක් අප දිස්ත්‍රික්කය සතුව ඇති අතර, දකුණු පළාතේ භූමි ප්‍රමාණයෙන් 23.14% ක් වශයෙන් මුළු බිම් ප්‍රමාණය හැඳින්විය හැකිය. මාතර දිස්ත්‍රික්කය දකුණු වෙරළබඩ සිට උතුරේ අඩි 3880ක් දක්වා නැගීමක් පෙන්නුම් කරන අතර, උතුරේදී ලෝක උරුමයන් බවට පත්ව ඇති සිංහරාජ වනගහනයෙන් ආකර්ශනීය දිය ඇළි වලින් සමන්විත වේ. දකුණින් දර්ශනීය මුහුදු තීරයකින්ද, උතුරින් රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න, කලවාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද බටහිර ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව, ඉමදුව, යක්කලමුල්ල, තවලම නෙළුව යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්ගෙන්ද නැගෙනහිරින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕකේවෙල, බෙලිඅත්ත, කටුවන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද මායිම්ව මාතර දිස්ත්‍රික්කය පිහිටා තිබේ.




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 845,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 641,047 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 16 |
| ග්‍රාම සේවා වසම් ගණන | 650 |





ශ්‍රී ලංකාවේ ගිනිකොණ දිග සීමාව පිහිටා ඇති හම්බන්තොට දිස්ත්‍රික්කය විශාලත්වයෙන් වර්ග කි.මී. 2609 කි. මෙය දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 1/25 පමණ වේ. දිස්ත්‍රික්කයේ උපරිම දිග කි.මී. 106 ක්ද උපරිම පළල කි.මී. 39 ක්ද වේ. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත්වන වෙරළබඩ තීරයේ දිග කි.මී. 151 කි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් ව.කි.මී. 11.5 ක් පමණ අභ්‍යන්තර ජලාශ වලින් වැසී ඇත. උතුරට මොණරාගල හා රත්නපුර දිස්ත්‍රික්කවලින්ද බටහිර මාතර දිස්ත්‍රික්කයෙන්ද දකුණට ඉන්දියන් සාගරයෙන්ද නැගෙනහිරට ඉන්දියන් සාගරයෙන් හා අම්පාර දිස්ත්‍රික්කයෙන්ද මෙම දිස්ත්‍රික්කය මායිම් වී ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇති ස්වභාවධර්මයේ සුවිශේෂී දායාදයන් වන තංගල්ල ප්‍රා.ලේ. කොට්ඨාශයේ පිහිටි හුම්මානය හා සූරියවැව ප්‍රාදේශීය ලේකම් පිහිටි උණු දිය උල්පත් හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උසන්ගොඩ ප්‍රදේශය මෙරට දක්නට ඇති දුර්ලභ භූ විද්‍යාත්මක ලක්ෂණයන්ය. අම්බලන්තොටින් ඔබ්බෙහි පිහිටි මදුනාගල නම් සුපතල ආරණ්‍ය සේනාසනයට නුදුරින් මේ උණුදිය උල්පත් පිහිටා ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජලවහන රටාව ප්‍රධාන ගංගා සහ ස්වභාවික ජල මාර්ග 19 ක් පිහිටා ඇත. මේ අතරින් වලවේ ගඟ, කිරිඳි ඔය, මැණික් ගඟ, ඌරුබොකු ඔය, හා කච්චිගල්ආර මෙන්ම දිස්ත්‍රික්කයේ නැගෙනහිර මායිමේ පිහිටි කුඹුක්කන් ඔය ද ප්‍රධාන ජල මාර්ග වේ. දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධාන වැව් හා අභ්‍යන්තර ජලාශ 13 න් විශාලතම වැව රිදියගම වැව වුවද වැඩිම ජල ධාරිතාවක් අඩංගු වන්නේ මුරුතවෙල හා ලුණුගම්වෙහෙර යන ජලාශ වලය. වැඩි වැව් ප්‍රමාණයක් පිහිටා ඇත්තේ තිස්සමහාරාමය ප්‍රදේශය ආශ්‍රිතවය. දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන වශයෙන් වාරිමාර්ග සංවර්ධන යෝජනා ක්‍රම කිහිපයක් පසුගිය අවදියේ ක්‍රියාත්මක වී ඇත. උඩවලව සංවර්ධන ව්‍යාපාරය, කිරම ඔය ව්‍යාපාරය, ඌරුබොකු ඔය ව්‍යාපාරය, ලියන්ගස්තොට ව්‍යාපාරය, රිදියගම ව්‍යාපාරය, ලුණුගම්වෙහෙර ව්‍යාපාරය, මව්ආර ව්‍යාපාරය සහ කැකිරිඹබඩ ව්‍යාපාරය මේවා අතර වේ.




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 637,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 475,510 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 12 |
| ග්‍රාම සේවා වසම් ගණන | 576 |



## අම්බලන්තොට නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලට මුල් ගල තැබීම







කලක සිට විශාල අඩුපාඩුවක්ව පැවති අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැඟිල්ල සඳහා රු.ලක්ෂ 500 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ පරමාර්ථයෙන් සුභ මොහොතින් මුල්ගල් තැබූ වගයි.

ඔකේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ලට මුල්ගල තැබීම






කටුවන නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම





වීරකැටිය නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම








ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ උතුරු අග පිහිටි යාපනය දිස්ත්‍රික්කය කොළඹ සිට කි.මී. 410 කට එපිටින් පිහිටා ඇත.එය අර්ධද්වීපයකින් හා ජනයා වාසය කරන දිවයින් 07කින් සමන්විත වෙයි. දිස්ත්‍රික්කයේ උතුරු නැගෙනහිර හා බටහිර මායිම් වන්නේ ඉන්දියන් සාගරයට වන අතර දකුණින් යාපනය කලපුව හා කිලිනොච්චි දිස්ත්‍රික්කය වෙයි. දිවයිනද ඇතුළුව මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී. 1012.01 වන අතර යාපනය දිස්ත්‍රික්කය උප කොටස් හතරකට බෙදා ඇත. ඒවා නම් දිවයින්, වලිකාමම්, තෙන්මරච්චි හා වඩමාරච්චිය. දිස්ත්‍රික්කය පුරා පොකුණු 1084ක් හා අභල් 2433ක් විසිරී පවතින අතර ඒවා වැසි ජලය සංරක්ෂණය කිරීමේ මාර්ග සහිත ඒවාය. අතිරික්ත ජලය ඉතා පහසුවෙන් මුහුදට/කලපුවට ගලායයි.මුහුදු මට්ටමේ සිට ඇති උස මෙපරිදිය. පේදුරුතුඩුව මී.15.24, මයිලිඩඩි මී.10.8, චන්කනෙයි මී.3.04, කොකුවිල් මී.6.09.





The Sunday Times Map by Ramesh Kandasamy




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 622,709 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 463,726 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 15 |
| ග්‍රාම සේවා වසම් ගණන | 435 |

රුපියල් ලක්ෂ 847ක වියදමින් ඉදිකරන ලද යාපනය නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය පරිපාලන සංකීර්ණය ගරු අග්‍රමාත්‍ය, රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් ජනතා අයිතියට පත්කල වගයි.



ශ්‍රී ලංකාවේ වයඹ දෙසින් උතුරට මන්නාරම දිස්ත්‍රික්කය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ දකුණු දිශාවෙන් පුත්තලම දිස්ත්‍රික්කයද, ගිණිකොන දිශාවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයද, නැගෙනහිර දිශාවෙන් වවුනියා දිස්ත්‍රික්කයද, ඊසාන දිශාවෙන් මුලතිව් දිස්ත්‍රික්කය හා උතුරු දිශාවෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කයද මායිම් ලෙස පිහිටා ඇත. තිරුකේදීශ්වරම් කෝවිළ, මරද මඩු දේවස්ථානය, ඕලන්ද කොටුව, ආරිප්පු කොටුව, ආරුප්පු අල්ලිරාණි කොටුව, රාමා (ආදම්ගේ) පාලම, වැල් පාලම, බයෝබැබ් ගස හා ප්‍රදීපාගාරය දිස්ත්‍රික්කය තුළ වැදගත් ස්ථාන හඳුන්වා දිය හැකිය. මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වශයෙන් කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය හැඳින්විය හැකිය. 70% ක් කෘෂිකර්මය, 25% ක් ධීවර, 5% ක් වෙනත් රැකියාවල නිරත වන අතර 61.4% වී වගා කටයුතු වල යොමු වී සිටියි. ඉහත ආර්ථික කටයුතු සිදු කරනු ලබන පිරිමින් 70.5%ක් පමණ සිටී.






| විස්තරය | ප්‍රමාණය |
| --- | --- |
| ජනගහනය | 162,262 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 84,764 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 05 |
| ග්‍රාම සේවා වසම් ගණන | 153 |








| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 191,416 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 112,573 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 04 |
| ග්‍රාම සේවා වසම් ගණන | 102 |

මෙම දිස්ත්‍රික්කය නැගෙනහිරින් අනුරාධපුර දිස්ත්‍රික්කයටද, මුලතිව් දිස්ත්‍රික්කයටද, උතුරින් මුලතිව් දිස්ත්‍රික්කයට ද, බටහිරින් මන්නාරම දිස්ත්‍රික්කයටද, මුලතිව් දිස්ත්‍රික්කයේ කොටසකට ද, දකුණෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ද සීමා වී ඇත. ප්‍රසිද්ධ ඒ-9 මාර්ගය, කොළඹ කොටුවේ සිට කන්කසන්තුරේ දක්වා දිවෙන දුම්රිය මාර්ගයෙන් ද කොළඹ කොටුව සිට තලෙයිමන්නාරම් දක්වා දිවෙන දුම්රිය මාර්ගය ද මෙම දිස්ත්‍රික්කය හරහා පිහිටා ඇත. කනකරායන් කුලම් ආරු, පාලි ගඟ, පරංගි ගඟ යන ප්‍රධාන ගංගාවන් ද වෙනත් අතු ගංගාවන් ද මෙම දිස්ත්‍රික්ක හරහා ගලා බසී. ජල සම්පත් හා සාරවත් පසින් යුතු වවුනියා දිස්ත්‍රික්කය භූගෝලීය පිහිටීම අනුව කුඩා පරිමාණයේ පාෂාණ ස්ථරයකින් සමන්විතයි. මෙම දිස්ත්‍රික්කයේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් බවට පත් වුවද කුඩා ප්‍රමාණයේ කර්මාන්තයන් වන ඇගළුම් නිෂ්පාදන, සත්ව පාලනය, වෙළඳාම, යනාදි කර්මාන්තයන් ද පවත්වාගෙන යයි. අවශ්‍ය ප්‍රමාණයන්ටත් වඩා අධික ලෙස එකතුවන කිරි නිෂ්පාදනයෙන් වෙනත් කිරි ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම වෙනුවෙන් පිට දිස්ත්‍රික්ක වලට යවනු ලැබේ. වී නිෂ්පාදනයෙන් මෙම දිස්ත්‍රික්කය ස්වයංපෝෂිත වූ අතර අතිරේක නිෂ්පාදන වන වී සහ සහල් වශයෙන් වෙනත් දිස්ත්‍රික්කවලට රැගෙන යනු ලැබේ. දිස්ත්‍රික්කය තුල සමහර ප්‍රදේශවල ඇල දොළ ගංගාවන්හි කුඩා ප්‍රමාණයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය පවතින අතර විශාල වශයෙන් මුහුදු මාළු මන්නාරම්, මුලතිව්, ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රික්කවල සිට වවුනියාවට රැගෙන එනු ලැබේ. කෘෂිකර්මාන්තය, කුඩා පරිමාණ කර්මාන්තයන් වන පශු සම්පත් සත්ව පාලනය, වෙළඳාම මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයන් වේ.








| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 134,074 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 71,774 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 06 |
| ග්‍රාම සේවා වසම් ගණන | 136 |

1979 වර්ෂයේ දී අලුතින් පිහිටුවන ලද දිස්ත්‍රික්ක වලින් මුලතිව් දිස්ත්‍රික්කය එකක් ලෙස හැඳින්විය හැකිය. මන්නාරම, ත්‍රිකුණාමලය හා වවුනියා යන දිස්ත්‍රික්කවල කොටස්වලින් සමන්විත මෙම නව දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන් උතුරු පළාතේ නැගෙනහිර කොටස අඩංගු ප්‍රදේශයයි. මුලතිව් දිස්ත්‍රික්කයේ මායිම් වනුයේ උතුරින් කිලිනොච්චි දිස්ත්‍රික්කයද, දකුණින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයද, වවුනියා දිස්ත්‍රික්කය හා මන්නාරම් දිස්ත්‍රික්කයේ කොටසක් ද, බටහිරින් මන්නාරම් දිස්ත්‍රික්කය ද නැගෙනහිරින් මුහුද ද වේ. මෙම දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණය දළ වශයෙන් වර්ග කි.මී.25169ක් වන අතර (වනාන්තර ඇතිව හා විශාල අභ්‍යන්තර ජල ප්‍රදේශ හැර) රටේ භූමි ප්‍රමාණයෙන් 3.8%කි. සමතලා වූ මෙම ප්‍රදේශය උතුරු හා නැගෙනහිර දෙසට බෑවුම් ව ද බටහිර දෙසින් , දකුණ හා බටහිර දෙසට බෑවුම් ව ද පිහිටා ඇත. මෙම දිස්ත්‍රික්කයේ මුහුදු තීරය කි.මී.70ක් වන අතර, කෝක්කිලායි, නයාරු,නන්දිකඩාල් හා මාතලන් නැමැති ඉස්සන් බහුල කලපු හතරකින්ද සමන්විතය. මෙම දිස්ත්‍රික්කය මුහුදු මට්ටමේ සිට සාමාන්‍ය උස මීටර් 36.5ක් දක්වා වෙනස් වේ.ප්‍රදේශයේ පිහිටි රතු, දුඹුරු, මෙන්ම රතු, කහ පැහැති ලැටෝ වර්ගයේ පස වගාවට ඉතාමත් සුදුසු වේ. මෙම දිස්ත්‍රික්කයේ ඉඩම් හෙක්ටයාර් 251,690ක වනාන්තර ලඳු කැලෑ, කෘෂි බිම්, පොල් වගාව, ජනාවාස සහ ගොඩනැගිලි වැනි විවිධ කටයුතු සඳහා භාවිතා වේ. මෙයින් වනාන්තර වශයෙන් හෙක්ටයාර් 167,850ක් එනම් දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණයෙන් 64.1%කි. ජලයෙන් යට වී ඇති ප්‍රදේශ හා මුඩුබිම් වශයෙන් හෙක්ටයාර් 21,390ක් එනම් දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණයෙන් 5.2%ක් වශයෙන් ද, කෘෂි කර්මය සඳහා හෙක්ටයාර් 44,040ක් එනම් දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණයෙන් 5.1%ක් ද, ඉතිරි ප්‍රමාණය ජනාවාස හා ගොඩනැගිලි සඳහා ද භාවිතා වේ. මෙම දිස්ත්‍රික්කයේ මහා පරිමාණ වාරිමාර්ග 03ක් ද මධ්‍ය ප්‍රමාණයේ වාරිමාර්ග 16ක් ද කුඩා ප්‍රමාණයේ වාරිමාර්ග 198ක් ද පිහිටා ඇත.







| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 141,665 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 84,353 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 04 |
| ග්‍රාම සේවා වසම් ගණන | 95 |

යාපනය දිස්ත්‍රික්කය සමග ඒකාබද්ධව තිබූ කිළිනොච්චි ප්‍රදේශය නව දිස්ත්‍රික්කයක් ලෙස 1984 වන වර්ෂයේ පෙබරවාරි මස 3 වන දින ස්ථාපිත කරන ලදි. කිළිනොච්චිය කරඩිපෝක්කු හන්දියේ තිබෙන වී අලෙවි මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලේ පළමුවන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 1984.02.03 වන දින ආරම්භ කරන ලදී. 1985 වර්ෂයේ ඒ 9 පාරේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකර එහි කාර්යාලයන් ක්‍රියාත්මක වෙමින් පැවතුනේය.ඓතිහාසික වැදගත්කමකින් යුතු උරුත්තිපුරම් ශිවන් කෝවිල පුලියම්පොක්කනෙ නාගතම්බිරාන් කෝවිල, මන්නිත්තලෙයි ශුද්ධ වූ අන්තෝනි මුනිදු කිතුණු දේවස්ථානය, පාලයිතිවු ශුද්ධ වූ අන්තෝනි මුනිදු දේවස්ථානය පොන්නාවෙලි ශිවන් කෝවිල හා පූනකර් ඕලන්ද කොටුව ආදිය සැලකේ. ස්වාභාවික සම්පත් වන ඉරණමඩු වැව, චුණ්ඩික්කුලම් පක්ෂි අභය භූමිය , කෞදාරිමුනයි මුහුදු වෙරළ ආදිය පිහිටා ඇත. මෙම දිස්ත්‍රිත්කය දළ වශයෙන් වර්ග කිලෝ මීටර් 1237.11 බිම් කොටසකින්ද, වර්ග කිලෝ මීටර 44.3ක අභ්‍යන්තර ජල ප්‍රදේශයන්ගෙන්ද සමන්විත ව පිහිටා තිබේ. මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන රැකියාව කෘෂිකර්මාන්තය වේ. බහුතරයක් වී ගොවිතැනෙහි නිරත ව සිටින අතර, අනෙක් පිරිස් උප ආහාර භෝග වගාව, පළතුරු වගාව, ගව, එළු කුකුල් වැනි සත්ව පාලන රැකියාවන්වල ද යෙදී සිටිති. ඒ සමග ධීවර කර්මාන්තය දෙවැනි ස්ථානය ලගා කරගෙන මෙම ජනතාවගේ ජීවනෝපායට සහය වේ. කිළිනොච්චි දිස්ත්‍රික්කයේ වාරිමාර්ග හා කෘෂිකර්ම වර්ධනය සලකා බැලීමේ දී, ඉරණමඩු වැව හා වාරිමාර්ග ව්‍යාපෘතිය ද ප්‍රධාන තැනක් ගන්නා අතර කිළිනොච්චියේ ජීවත් වන ජනතාවගේ ප්‍රාණය ලෙස ද පවතී. දිස්ත්‍රික්කයේ පදිංචි ව සිටින ගොවි පවුල් 21208 ක් ගොවි පවුල් 9495 ක් ඉරණමඩු ව්‍යාපෘතිය යටතේ ගොවිතැන් කටයුතු වල නිරත වන අයවලුන් වන අතර මෙය දිස්ත්‍රික්කයේ සම්පූර්ණ ගොවිපවුල් සංඛ්‍යාවෙන් 40% ක් වේ. තව ද ඉරණමඩු වාරිමාර්ග ව්‍යාපෘතියේ වී වගාව පමණක් නොව උප ධාන්‍ය වගාවන් වන කවුපි, උඳු, මුං වැනි දෑ ද වගා කර කෘෂිකර්මයෙන් සපිරි ස්ථානය කරා ගෙනයමින් කිළිනොච්චි දිස්ත්‍රික්කය දියුණු මාර්ගයක ගමන් කිරීම දැක ගත හැකි ව තිබේ. තව ද වැව් 464 ක් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරමින් පවතී.



මෙය වෙරළතීරයේ දිස්ත්‍රික්කයක් වන බැවින්, මුහුදු සම්පත් ප්‍රධාන සම්පතක් වශයෙන් දක්නට ලැබේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක් ඇතුලත්ව ග්‍රාම නිලධාරී වසම් 76 ක්ම පිහිටා ඇත්තේ වෙරළ තීරුවේය. මෙය වර්ග කි.මී.119.43 වේ. මෙම කළාපයේ ජීවත්වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපායෙන් එකක් ලෙස කරදිය ධීවර කර්මාන්තය දක්වති. එසේම දිස්ත්‍රික්කයේ නමට ගැලපෙන සේ කල්ලාරු සිට වාලච්චේනයි දක්වා වර්ග කි.මී.229.19 ක අන්තර් ජලයෙන් සමන්විත ඉතා දිගු කලපුවක් පිහිටා ඇති අතර, මෙය දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණයෙන් 8.70% වේ. මඩකලපුව පැරණි වරාය නගරයක් ලෙස තිබුනු අතර, මෙහිදී භාවිතා කරනු ලැබූ ක්‍රේන් යන්ත්‍ර තවමත් ගාන්ධි උද්‍යානයේ කලපුව අසල දැකගැනීමට හැකිය. පාසිකුඩා වෙරළ රැළි නැති සුප්‍රසිද්ධ වෙරළ තීරයක් වන අතර, මෙය ශ්‍රී ලංකාවේ දේශිය හා විදේශීය සංචාරකයින්ගේ ප්‍රියතම වැදගත් සංචාරක ස්ථානයක් වේ. දිස්ත්‍රික්කයේ ප්‍රධාන වෘත්තියක් වන කුඹුරු වගාවට සුදුසු රොන්පස සංයුක්තය දිස්ත්‍රික්කයේ බටහිර දිසාවේ දක්නට ලැබේ.මෙය දිස්ත්‍රික්කයේ ස්වයංපෝෂිත වීමට හා හාල් නිෂ්පාදනය කරන ප්‍රධාන දිස්ත්‍රික්කයක් වීමටත් හේතුවක් වී ඇත






| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 601,671 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 383,429 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 14 |
| ග්‍රාම සේවා වසම් ගණන | 345 |



මඩකලපුව නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලට මුල්ගල තැබීම





රු. මිලියන 804 ක ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් ඇරඹි මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

මන්මුනෙයි පත්තු නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම





වවුනතිවු නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම



## ඔඩ්ඩමාවඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ලට මුල්ගල තැබීම





## වාකරේ සංචාරක බංගලාව විවෘත කිරීම











හෙක්ටයාර් 205,978ක් වු ඉඩම් ප්‍රමාණයක් හා හෙක්ටයාර් 19280 ක් තරම් භූමි භාගයකට යට වු අභ්‍යන්තර ජල තටාක වලින් සමන්විත වූ අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල, ද්‍රවිඩ , මුස්ලිම් යන ත්‍රිවිද ජාතීන්ම ජිවත් වේ. උතුරින් පොළොන්නරුව හා මඩකලපුව යන දිස්ත්‍රික්කවලටත් නැගෙනහිරින් ඉන්දීයන් සාගරයටත් දකුණින් හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්ක වලටත් බටහිරින් බදුල්ල හා මාතලේ යන දිස්ත්‍රික්ක වලටත් මායිම් වන අම්පාර දිස්ත්‍රික්කයේ වර්ග ප්‍රමාණයක් වර්ග කි.මි.4415කි. අම්පාර ආගමික හා සංස්කෘතික උරුමයන් පිළිබඳ ඓතිහාසික වටිනාකමක් සහිත දිස්ත්‍රික්කයකි. පියංගල, බුද්ධංගල වැනි ආරණ්‍ය සේනාසන ද රජගල,දිඝවාපිය, මඟුල් මහ විහාරය, මුහුදු මහ විහාරය, නීලගල සෑය හා කූඩුම්බිගල වැනි පුරා විද්‍යා වටිනාකමක් ඇති ආගමික සිද්ධාස්ථාන ද ඒ අතරින් වැදගත් තැනැක් ගනී. එසේම මහඔය හා පදියතලාව ප්‍රදේශවල ඇති උණු දිය උල්පත් ආරුගම්බේ මනරම් මුහුදු වෙරළ තීරයත් කතරගම වන්දනා කරන බැතිමතුන්ගේ පාද වාරිකාවේ යෙදෙන මාර්ගයත් පිහිටා තිබීම මෙම ප්‍රදේශයට සංචාරකයින්ගේ පැමිණීම වැඩි කරවන සාධක වේ. එසේම දිස්ත්‍රික්කයේ තැන තැන දක්නට ලැබෙන (පොල්ලේබැද්ද, හේනානිගල) ආදී වාසී ගම්මානද පැවතිම වෙනත් දිස්ත්‍රික්කවලට වඩා වෙනස් වු සංස්කෘතියක දායාදයක් ලැබීම මෙම දිස්ත්‍රික්කය අතිශයින් මනරම් වූ දිස්ත්‍රික්කයක් වීමට හේතු වේ. එසේම අම්පාර දිස්ත්‍රික්කය කල්මුණ මහ නගර සභාව, අම්පාර නගර සභාව ඇතුළුව නාමල්ඔය, උහන, දමන, මහඔය, පදියතලාව, දෙහිඅත්තකණ්ඩිය, ලාහුගල. සම්මන්තුර, අක්කරපත්තුව, අඩ්ඩාලචේන, ආලයඩිවෙම්බු, තිරුක්කෝවිල්, නාවිදන්වෙලී, එරගම, නින්දවූර්. කාර්තිව් හා පොතුවිල් යන ප්‍රාදේශීය සභා 17කින් සමන්විත වන සේ සංවිධානය වී ඇත.




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 691,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 486,440 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 20 |
| ග්‍රාම සේවා වසම් ගණන | 503 |





දිගු ඓතිහාසික පසුබිමක් ඇති, ස්වභාවික වරායකින් යුතු, වෙළඳ, කෘෂිකාර්මික හා ධීවර වැනි ආර්ථික කටයුතුවලින් පිරිපුන් එමෙන්ම ස්වභාව සෞන්දර්යයෙන් අනූන ස්ථානවලින් සමන්විත ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පිහිටි දිස්ත්‍රික්කයකි. එය උතුරින් මුලතිවු දිස්ත්‍රික්කයෙන්ද බටහිරින් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් සහ දකුණින් මඩකලපුව හා පොළොන්නරුව දිස්ත්‍රික්කවලින් ද මායිම්ව පිහිටා තිබේ. ත්‍රිකුණාමලය ඉතිහාසය ස්මරණය කිරීමට අපහසු අතීතයක් දක්වා දිව යන්නකි. ලංකා ඉතිහාසයේ අනුරාධපුර යුගයේ ප්‍රකට ඉතිහාස ග්‍රන්ථ දෙකක් වන මහාවංශය හා චූලවංශය 'ගෝකණ්ණ', 'ගෝකර්ණ',සහ 'ගෝණගාමක' ලෙස ත්‍රිකුණාමලය හඳුන්වා ඇත. නැගෙනහිර පළාතේ පිහිටි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වර්ග කි.මී. 2,728.8 ක් පුරා විහිද ඇත.එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11ක් හා ග්‍රාමනිලධාරී කොට්ඨාශ 230 කින් සමන්විත වේ. කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම්ය.වී වගාව ප්‍රධාන කෘෂි බෝගයයි.කන්තලේ වැව, වෙන්ඩ්‍රාස වැව, මොර වැව මහා දිවුල් වැව සහ පරවිකුලම එහි ප්‍රධාන වැව් කිහිපයකි. එමෙන්ම කන්තලේ, අල්ල කන්තලේ සහ මොරවැව ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති තුනකි. පශු සම්පත් හා ගව පාලනය තවත් ප්‍රධාන ජීවනෝපායකි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ලොව පතළ වෙරළ තීරයකින් සහ සංචාරක ස්ථානවලින් සමන්විත වීම නිසා සංචාරක කර්මාන්තය ද ආර්ථික වශයෙන් දිස්ත්‍රික්කය තුල වැදගත් කාර්යයක් ඉටු කරනු ලැබේ. තවද උපායමාර්ගික අතින් වැදගත් ස්ථානයක පිහිටීමත්, ස්වභාවිකව පිහිටි වරායත් නිසා ප්‍රීමා ශ්‍රී ලංකා සහ ටෝකියෝ සිමෙන්ති වැනි ජාත්‍යන්තර සමාගම් සිය නිෂ්පාදන හා බෙදාහැරීමේ මධ්‍යස්ථාන ත්‍රිකුණාමලය නගරය කේන්ද්‍ර කරගෙන පිහිටුවා තිබේ.




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 423,181 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 257,061 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 11 |
| ග්‍රාම සේවා වසම් ගණන | 230 |



## ගෝමරන්කඩවල නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම
















| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 1,658,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 1,304,995 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 30 |
| ග්‍රාම සේවා වසම් ගණන | 1,610 |

වයඹ පලාත තුළ පිහිටා ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් 4812.7කි. එනම් හෙක්ටයාර් 481270 කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 කි. ග්‍රාමසේවා වසම් 1610 ක් අයත් වෙයි. දිස්ත්‍රික්කයේ මුළු ගම්මාන සංඛ්‍යාව 4432 ක් වන අතර ජන්ද කොට්ඨාශ 14 කි. දිස්ත්‍රික්කයේ මහ නගර සභා 01 ක් හා නගර සභා 01ක් ඇත. ප්‍රාදේශීය සභා 19 කි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 6කි. පාසල් 875කි. මෙයින් 28ක් ජාතික පාසල් වෙයි. දිස්ත්‍රික්කයේ මුළු ගුරුවරු සංඛ්‍යාව 20223 ක් වෙයි. සාපේක්ෂ වශයෙන් ගත් කල කුරුණෑගල දිස්ත්‍රික්කය, දිස්ත්‍රික්ක 5 කින් වටවී ඇත. එනම් උතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයත්, නැගෙනහිරින් මාතලේ දිස්ත්‍රික්කයත්, දකුණින් ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික්කත්, බස්නාහිරින් පුත්තලම දිස්ත්‍රික්කයත් වේ. දිස්ත්‍රික්කයේ නිරපේක්ෂ පිහිටීම උතුරු බණ්ඩාංක 228-333 සහ නැගෙනහිර බණ්ඩාංක 104-178 ක් අතර වෙයි. ඓතිහාසික පසුබිම පිළිබඳ කතා කරන විට කුරුණෑගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ අන් දිස්ත්‍රික්ක වලට වඩා වැඩි සුවිශේෂී තාවයක් ගනී. එනම් රාජධානි 4ක් පැවති ලංකාවේ එකම දිස්ත්‍රික්කය ලෙස අභිමානයක් කුරුණෑගලට හිමිව තිබීමයි. පඩුවස්නුවර, කුරුණෑගල, යාපහුව, දඹදෙණිය එම රාජධානීන් වන අතර මෙම රාජධානි යුග වලදී කීර්තිමත් රජවරු රැසක්ම සිටි බවට සාක්ෂි ඕනෑතරම් හමුවේ. දිස්ත්‍රික්කයේ මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි ලීටර් 900-2200 අතර වෙයි. ඊසාන දිග මෝසම් සුළං හා නිරිත දිග මෝසම් සුළං හා සංවහන ක්‍රියාකාරීත්වය නිසා ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය ලැබෙන අතර වැඩිම ප්‍රමාණයක් ලැබෙනුයේ නිරිත දිග මෝසම් සුළං ප්‍රවාහය මගිනි.



වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ලව මුල්ගල තැබීම



ලාංකික වංශ කථාවේ නිජ භූමිය වූ පුත්තලම (තම්බපන්නි) දීර්ඝ ඉතිහාසයක් ඇති භූමිභාගයකි. පුත්තලම දිස්ත්‍රික්කය මුහුදු මට්ටමින් අඩි 300ට අඩු උසකින් පිහිටි බිම් තීරුවකි. උතුරින් කලා ඔයටද, නැගෙනහිරින් කුරුණෑගල දිස්ත්‍රික්කයටද, දකුණෙන් මා ඔයෙන් ද, බටහිරින් ඉන්දියන් සාගර වෙරළ තීරයෙන්ද සීමා වී පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය පිහිටා ඇත. දිස්ත්‍රික්කය තුල වැඩිම දිග කි.මී.120 වන අතර පළල කි.මී.50 පමණ වේ. දිගින් කි.මී.288 ක් වූ වෙරළබඩ තීරයෙන්ද අභ්‍යන්තර ජල පෝෂිත ප්‍රදේශ සමඟ ව.කි.මි.3072 භූමි ප්‍රමාණයක් මෙම දිස්ත්‍රික්කයට අයත් වේ. පොල් ත්‍රිකෝණයට අයත් පුත්තලම දිස්ත්‍රික්කය පොල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන අපනයනය මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායකත්වයක් දක්වයි. එමෙන්ම අතීතයේ සිට පවතින වාරිමාර්ග පද්ධතිය නිසා වී ගොවිතැන මෙහි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වී ඇත.








| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 790,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 579,604 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 16 |
| ග්‍රාම සේවා වසම් ගණන | 548 |

පුත්තලම් දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැඟිල්ලකට මුල්ගල තැබූ වගයි.



බහු ආගමික, බහු භාෂික ජනතාවක් ජීවත්වන අනුරාධපුර දිස්ත්‍රික්කය උතුරින් වව්නියාව, මන්නාරම, මුලතිව් දිස්ත්‍රික්කවලින් ද , දකුණින් කුරුණෑගල, මාතලේ යන දිස්ත්‍රික්ක වලින් ද , බටහිරින් පුත්තලම හා මන්නාරම දිස්ත්‍රික්ක හා නැගෙනහිරින් පොළොන්නරුව හා ත්‍රිකුණාමළය යන දිස්ත්‍රික්කවලින් සමන්විත අනුරාධපුර දිස්ත්‍රික්කයේ සීමාවන් පවතී. ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ ඇතුළු අටමස්ථානය ප්‍රමුඛ කොට අතිපූජනීයත්වයට පත් ඓතිහාසික උරුමයන්ගෙන් යුත් ස්ථාන මෙන්ම මිහින්තලේ රජමහා විහාරය, තන්තිරිමලේ රජමහා විහාරය, අවුකන පිළිමය ඇතුළු ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන රැසක් මෙම නගරය තුළ දර්ශනය වන අතර එම පසුබිම දෙස විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක්වී ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවෙනෝපාය කෘෂි කර්මාන්තය වන අතර වී ගොවිතැන ප්‍රධාන භෝගය වෙයි. අතිරේක භෝග වශයෙන් සෝයා, බඩ ඉරිඟු, උඳු , තල, ලොකු ළූණු වලින් දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවයන් සපුරා ගනී. මෙයින් බඩඉරිඟු හා සෝයා භෝගයන් ජාතික අවශ්‍යතාවය සම්පූර්ණ කර දීමට කටයුතු කරයි. අහස් දිය හා වාරි පද්ධතිය උපයෝගී කරගෙන වගාවට ජලය සපයා ගනී. වර්තමාන ඉංජිනේරු ක්ෂේත්‍රය පවා මවිත කරවන ඉපැරණි වාරි කළමණාකරණ තාක්ෂණ පද්ධතියකින් හෙබි මෙම දිස්ත්‍රික්කය තුළ කලාවැව, තිසාවැව, නුවරවැව, අභයවැව, නාච්චාදූව, රාජාංගනය හා පදවිය ඇතුළුව ප්‍රධාන වැව් 12 කින්ද, මධ්‍ය වැව් 85කින් ද , සුළු වැව් 2974කින් ද , වාරි පද්ධතිය සමන්විත වේ. ඉතා කුඩා පරිමාණයේ වැව් රාශියක් ද ඇත.




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 905,231 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 653,151 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 22 |
| ග්‍රාම සේවා වසම් ගණන | 694 |








| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 419,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 314,365 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 07 |
| ග්‍රාම සේවා වසම් ගණන | 295 |

ශ්‍රී ලංකාද්විපයේ දෙවන රාජධානිය ලෙසින්, පැරකුම් රජු දවස සිට සිරිලක සහලින් ස්යවංපෝෂිත කළ ඓතිහාසික පොළොන්නරුව පුරවරය අද වන විට ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ 07කින් සහ ග්‍රාම නිලධාරී වසම් 295කින් සැදුම්ලත්, ආර්ථික මෙන්ම සෞන්දර්යාත්මක සම්පත් රැසකින් හෙබි පුන්‍ය භූමියක් ලෙස දේශිය ආර්ථිකයට දායක වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ උතුරු මැද පලාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල කි.මී.216ක් දුරින් මහවැලි මිටියාවතේ තැනිතලා භූමියක පිහිටි පොළොන්නරුව වූ කලී වර්තමාන දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයයි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී.3337.9කි. උතුරු අක්ෂාංක 7’40 ’’-8 ‘21’’ හා නැගෙනහිර දේශාංශ 80’ 44’’ – 81’ 20 ’’ උන්නතාංශය අඩි 50-500කි. ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, මාතලේ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක වලින් මායිම්ව ඇත. දිස්ත්‍රික්කය පුරා ප්‍රධාන වැව් 04, මධ්‍යම ප්‍රමාණ වැව් 03, වැඩ කරන සුළු වැව් 62, වැඩ නොකරන සුළු වැව් 35 හා වැඩ කරන අමුණු 123 කිනුත් වැඩ නොකරන අමුණු 6 කිනුත් සමන්විතය.





පොලොන්නරුව නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මුල් ගල තැබීම



බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පාලනය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කි. එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 තුළ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 567 ක් ඇති අතර, එම ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුළ ගම් 1996 ක් හා දෙමළ ජනතාව ජීවත් වන වතු(වැවිලි) 186 ක් ඇත. ප්‍රාදේශීය සභා 14ක්, නගර සභා 02 ක් හා මහ නගර සභා 01 ක් මෙම දිස්ත්‍රික්කය තුළ දේශපාලන හා පරිපාලනය හා සම්බන්ධව පවතී. දිස්ත්‍රික්කයේ පවුල් 227,428කට වැඩි සංඛ්‍යාවක් ඇති අතර, එම පවුල් වල මුලු ජනගහනය 854000 ක් පමණ වේ.මෙම ජනගහනයෙන් 406,623 ක පිරිසක් සේවා නියුක්තව සිටින අතර, සේවා වියුක්තිකයන් සිටින සංඛ්‍යාව (ශ්‍රම බලකායට අයත්) 16,891 කි. බදුල්ල දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවගෙන් වැඩි පිරිසකගේ ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි. එනිසා, අඩු ආදායම් ලබන පිරිස ඉහළ මට්ටමක පවතී. රජයේ සමෘද්ධි වැඩසටහන යටතේ ආධාර ලබන සංඛ්‍යාව 59,273 කට ආසන්න වේ. විශ්‍රාම වැටුප් ලබන පිරිස 17,399 කට ආසන්න වේ.

**BADULLA DISTRICT**




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 854,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 643,580 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 15 |
| ග්‍රාම සේවා වසම් ගණන | 567 |





අතීතයේදී වෙල්ලස්ස ලෙස හැදින්වූ මොණරාගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා ගිණිකොණ දිශානුගතව ඌව පළාත තුල පිහිටා ඇත.මුළු බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 5959 ක් වන අතර ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම දිස්ත්‍රික්කය වේ. නිරපේක්ෂ පිහිටීම අනුව උතුරු අක්ෂාංශ 6° 17' ත් 7° 28' ත් සහ නැගෙනහිර දේශාංශ 80° 50' ත් 81° 35' ත් අතර පිහිටා ඇති ස්වභාවික සම්පත් වලින් අනූන භූමි ප්‍රදේශයකි. මෙම දිස්ත්‍රික්කය නැගෙනහිරින් හා උතුරින් අම්පාර දිස්ත්‍රික්කයෙන්ද බටහිරින් හා උතුරින් බදුල්ල දිස්ත්‍රික්කයෙන්ද දකුණින් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන්ද නිරිත දිගින් රත්නපුර දිස්ත්‍රික්කයෙන්ද මායිම් වී ඇත. මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කින් හා ග්‍රාම නිළධාරි වසම් 319 කින් ද ගම්මාන 1324 කින් සහ ප්‍රාදේශීය සභා 10 කින් සමන්විත වේ. සමස්ථයක් වශයෙන් මොණරාගල දිස්ත්‍රික්කය දේශගුණික කලාප බෙදීම අනුව අන්තර් මධ්‍ය දේශගුණික කලාපයට හා වියළි කලාපයට අයත්වේ. දිස්ත්‍රික්කයෙන් 70 % ක් පමණ වියළි දේශගුණික කලාපයට අයත් අතර මෙහි විශේෂත්වයක් වන්නේ දිස්ත්‍රික්කය මධ්‍යයේ පිහිටි මරගල කඳුවැටිය ආශ්‍රිත ප්‍රදේශය තෙත් කලාපීය දේශගුණික ලක්ෂණ පෙන්වයි. මෙය මෙරට තුල පිහිටි සුවිශේෂී වූ දේශගුණික කලාපයකි. දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මි. 1625 ක් පමණ වන අතර දිස්ත්‍රික්කයේ මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් 26° ක් පමණ වේ.









| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 472,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 355,474 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 11 |
| ග්‍රාම සේවා වසම් ගණන | 319 |






| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 1,127,000 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 831,579 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 17 |
| ග්‍රාම සේවා වසම් ගණන | 575 |

ශ්‍රී ලංකාවේ නිරිත දෙසින් පිහිටි රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටීම, ඓතිහාසික හා භූගෝලීය වශයෙන් එහි වාසය කරන ජනතාවගේ පැවැත්මට හා ආර්ථික වර්ධනයට බෙහෙවින් බලපා තිබේ. උතුරු අක්ෂාංශ 6 සිට 7 අතරද නැගෙනහිර දේශාංශ 80 සිට 81 අතරද පිහිටි රත්නපුර දිස්ත්‍රික්කය වර්ග ප්‍රමාණයෙන් වර්ග කිලෝ මීටර 3275.4කි. මෙම දිස්ත්‍රික්කය උතුරින් කෑගල්ල හා නුවරඑළි දිස්ත්‍රික්කද දකුණින් ගාල්ල මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කද බටහිරින් කොළඹ හා කළුතර දිස්ත්‍රික්කද නැගෙනහිරින් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක වලින් මායිම් වී ඇත. දැනට සොයාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව පැරණිතම මිනිසා එනම් බළංගොඩ මානවයා පිළිබඳ පාෂාණභූත ඇටසැකිළි සොයාගෙන ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේ බටදොඹලෙන හා බෙල්ලන්බැඳි පැලැස්ස වැනි ස්ථාන වලිනි. අනුරාධපුර යුගයේ ඇතැම් ස්ථාන වලින් ලැබුණු බ්‍රාහ්මී අක්ෂර ගණයට වැටෙන අක්ෂරවලින් යුතු සෙල්ලිපි මෙම ප්‍රදේශයෙන් ද සොයාගෙන ඇති අතර ඇඹිලිපිටිය කල්තොට වැනි ප්‍රදේශවලින් ලැබී ඇති අනෙකුත් නටඹුන් වලින්ද රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති ඓතිහාසික වටිනාකම පැහැදිලිවේ. මහනුවර යුගය වන විට රත්නපුර දිස්ත්‍රික්කය කෝරළ 6 ට බෙදී තිබූ බව පෙනේ. ඒවා නම් කුරුවිට, නවදුන්, අටකලන්, කුකුළු, කඩවත්මැද හා කොලොන්න කෝරළය වේ. රත්නපුර දිස්ත්‍රික්කයේ කොඩිය කසාවත් මුතු පාට කොඩියකි. සබරගමුවේ පුරාණ කොඩියෙන් සකස්කර ගන්නා ලද මෙහි විසිතුරු රතු දාරයක් ද කසාවන් පසුතලයක් ද ඇත්තේය. කසා වර්ණය සමන්තකූඨාධිපති සමන් දිව්‍ය රාජයාණන්ට කැප කරන ලද වර්ණය වේ. දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධාන පූජණීය ස්ථානය ශ්‍රී පාදස්ථානය වේ. අවුරුද්දේ උඳුවප් පොහොය දිනෙන් ඇරඹෙන ශ්‍රී පාද වන්දනා සමය ඊළඟ වසරේ වෙසක් පුර පසළොස්වක පොහොය දක්වා පවතී. රත්නපුර සමන් දේවාලයද එවැනි ඓතිහාසික වටිනාකමක් ඇති තවත් වැදගත් පූජණීය ස්ථානයකි.



සබරගමු පළාතේ පිහිටි කෑගල්ල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකර ප්‍රදේශයත් නිරිත දිග තැනිතලා ප්‍රදේශයත් අතරමැද පිහිටි රමණීය පරිසරයකින් යුත් බිම් ප්‍රදේශයකි. රුහුණු, මායා, පිහිටි යන ත්‍රි සිංහලයෙන් මායා රටට අයත් ප්‍රදේශයකි. පරිපාලනමය වශයෙන් දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11කට බෙදා දක්වා ඇත. කෑගල්ල දිස්ත්‍රික්කය උතුරු අක්ෂාංක 6.50 - 7.20 සහ නැගෙනහිර දේශාංක 80.10ත් 80.35ත් අතර පිහිටා තිබේ. උතුරින් කුරුණෑගල දිස්ත්‍රික්කයද, දකුණින් රත්නපුර දිස්ත්‍රික්කයද, නැගෙනහිරින් මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්ක වලින්ද, බටහිරින් ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක වලටද මායිම් වේ. කි.මී 48ක් වු උතුරු දකුණු විහිදීමකින් ද යුත් මෙම ප්‍රදේශය ව.කි.මි.1692.8(ව.සැ.645)ක විශාලත්වයකින් යුක්ත වේ. ශ්‍රීලංකා ඉතිහාසයේ දේශපාලන ආර්ථික, සමාජීය, ආගමික හා සංස්කෘතික තොරතුරු විමසා බලන විට කෑගල්ල දිස්ත්‍රික්කය දෙවනි වනුයේ අනුරාධපුරය සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවලට පමණි. ශ්‍රී ලංකාවේ හොඳම මිනිරන් නිධිය කෑගල්ල දිස්ත්‍රික්කයේ බෝගල පිහිටා ඇත. කෑගල්ල දිස්ත්‍රික්කය නිරිත දිග තෙත් කලාපයට අයත් වන අතර අධික වර්ෂාපතනයක් සහ අධික සූර්යතාපයක් ලැබෙන ප්‍රදේශයකි. මෝසම්, සංවහන හා වාසුළි මඟින් වර්ෂාව ලැබෙන බැවින් වර්ෂය පුරා ව්‍යාප්ත වු වර්ෂාපතන රටාවක් දැකිය හැකිය.




| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| ජනගහනය | 836,603 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | 665,817 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 11 |
| ග්‍රාම සේවා වසම් ගණන | 573 |



| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව | ග්‍රාම සේවා වසම් ගණන | ජනගහනය | ඡන්ද දායකයන් සංඛ්‍යාව | නගර සභා සංඛ්‍යාව | මහ නගර සභා සංඛ්‍යාව | ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | පාර්ලිමේන්තු මන්ත්‍රී ආසන සංඛ්‍යාව | පළාත් සභා මන්ත්‍රී සංඛ්‍යාව | කාර්යය මණ්ඩලය | | සංචාරක බංගලා/නිවාඩු නිකේතන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | අනුමත | සත්‍ය | |
| කොළඹ | 13 | 557 | 2309199 | 1649716 | 5 | 5 | 3 | 19 | 41 | 93 | 76 | 0 |
| ගම්පහ | 13 | 1177 | 2354000 | 1681887 | 5 | 2 | 12 | 13 | 40 | 3342 | 2848 | 0 |
| කළුතර | 14 | 762 | 1261000 | 930901 | 4 | 0 | 13 | 10 | 22 | 140 | 124 | 0 |
| මහනුවර | 20 | 1188 | 1416000 | 1086161 | 4 | 1 | 17 | 12 | 29 | 115 | 113 | 1 |
| මාතලේ | 11 | 545 | 508000 | 391892 | 0 | 2 | 11 | 5 | 11 | 32 | 30 | 1 |
| නුවරඑළිය | 5 | 491 | 740000 | 548971 | 1 | 2 | 5 | 9 | 17 | 97 | 75 | 1 |
| ගාල්ල | 19 | 896 | 1102000 | 843470 | 2 | 1 | 17 | 10 | 22 | 2057 | 1925 | 2 |
| මාතර | 16 | 650 | 845000 | 641047 | 1 | 1 | 15 | 7 | 17 | 1497 | 1613 | 1 |
| හම්බන්තොට | 12 | 576 | 637000 | 475510 | 1 | 1 | 10 | 7 | 17 | 1187 | 1193 | 1 |
| යාපනය | 15 | 435 | 622709 | 463726 | 3 | 1 | 13 | 8 | 16 | 1666 | 1265 | 1 |
| මන්නාරම | 5 | 153 | 162262 | 84764 | 1 | 0 | 4 | 6 | 5 | 444 | 315 | 2 |
| වවුනියාව | 4 | 102 | 191416 | 112573 | 1 | 0 | 4 | 6 | 7 | 451 | 309 | 1 |
| මුලතිව් | 6 | 136 | 134074 | 71774 | 0 | 0 | 4 | 6 | 11 | 70 | 56 | 1 |
| කිලිනොච්චි | 4 | 95 | 141665 | 84353 | 0 | 0 | 3 | 1 | 4 | 124 | 107 | 0 |
| මඩකලපුව | 14 | 345 | 601671 | 383429 | 1 | 2 | 9 | 5 | 11 | 1156 | 985 | 2 |
| අම්පාර | 20 | 503 | 691000 | 486440 | 1 | 2 | 17 | 7 | 14 | 1564 | 1387 | 2 |
| ත්‍රිකුණාමලය | 11 | 230 | 423181 | 257061 | 2 | 0 | 11 | 4 | 10 | 1035 | 664 | 2 |
| කුරුණෑගල | 30 | 1610 | 1658000 | 1304995 | 1 | 1 | 19 | 15 | 38 | 159 | 145 | 1 |
| පුත්තලම | 16 | 548 | 790000 | 579604 | 2 | 0 | 10 | 9 | 16 | 757 | 614 | 2 |
| අනුරාධපුරය | 22 | 694 | 905000 | 653151 | 0 | 1 | 18 | 7 | 22 | 1816 | 1501 | 1 |
| පොළොන්නරුව | 7 | 295 | 419000 | 314365 | 0 | 0 | 7 | 5 | 10 | 1153 | 849 | 2 |
| බදුල්ල | 15 | 567 | 854000 | 643580 | 1 | 2 | 14 | 8 | 34 | 1390 | 1257 | 1 |
| මොනරාගල | 11 | 319 | 472000 | 355474 | 0 | 0 | 10 | 5 | 14 | 915 | 795 | 3 |
| රත්නපුර | 17 | 575 | 1127000 | 831579 | 2 | 1 | 14 | 8 | 27 | 1484 | 1409 | 0 |
| කෑගල්ල | 11 | 573 | 836603 | 665817 | 1 | 0 | 11 | 11 | 18 | 1236 | 1142 | 0 |

**ප්‍රධාන කාර්යයන්**

- **ලියාපදිංචි කිරීම.**
  - ලේඛණ ලියාපදිංචි කිරීම (ඇටර්නි)
  - හිමිකම් ලියාපදිංචි කිරීම (ඉඩම්)
  - සිවිල් ලියාපදිංචි කිරීම (උප්පැන්න, විවාහ, මරණ)
- **භාරකාරත්වය සහ ලේඛන සංරක්ෂණය.**
  - ඉහත ලේඛණ, නොතාරිස් ඔප්පු දෙවන පිටපත් හා සංරක්ෂණය කළ යුතු අනෙකුත් ලියවිලි හා ලේඛණ වල භාරකාරත්වය සහ සංරක්ෂණය කිරීම.
- **සහතික පිටපත් නිකුත් කිරීම.**
  - සහතික පිටපත් නිකුත් කිරීමට නියමිත සියළු ලේඛණ වල සහතික කළ පිටපත් එසේ ලබා ගැනීමට බලය ලත් පුද්ගලයින්ට නිකුත් කිරීම.
  - උප්පැන්න, විවාහ, මරණ රෙජිස්ටාර්වරු පත් කිරීම සහ විනය පාලනය
  - නොතාරිස්වරු පත් කිරීම සහ නියාමණය

| | | |
|---|---|---|
| 1. | විවාහ , උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරු | 532 |
| 2. | විවාහ (අතිරේක) රෙජිස්ට්‍රාර්වරු | 345 |
| 3. | උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරු | 58 |
| 4. | උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරු | 27 |
| 5. | මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරු | 297 |
| | මුළු ගණන | 1259 |

| ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල | |
|---|---|
| 01. අම්පාර | 23. කුරුණෑගල |
| 02. අනුරාධපුරය | 24. කුලියාපිටිය |
| 03. අත්තනගල්ල | 25. කෑගල්ල |
| 04. අවිස්සාවේල්ල | 26. කොටපොල |
| 05. බදුල්ල | 27. මහනුවර |
| 06. බලපිටිය | 28. මතුගම |
| 07. මඩකලපුව | 29. මාතලේ |
| 08. හලාවත | 30. මන්නාරම |
| 09. කොළඹ | 31. මාතර |
| 10. දෙල්කඳ / නුගේගොඩ | 32. මාරවිල |
| 11. ඇල්පිටිය | 33. මොණරාගල |
| 12. ඇඹිලිපිටිය | 34. මුලතිව් |
| 13. ගම්පොල | 35. මීගමුව |
| 14. ගම්පහ | 36. නුවරඑළිය |
| 15. ගාල්ල | 37. නිකවැරටිය |
| 16. හෝමාගම | 38. පානදුර |
| 17. හොරණ | 39. පුත්තලම |
| 18. හම්බන්තොට | 40. පේදුරුතුඩුව |
| 19. යාපනය | 41.පොළොන්නරුව |
| 20. කළුතර | 42. රත්නපුර |
| 21. කල්මුණේ | 43. තංගල්ල |
| 22. කිළිනොච්චිය | 44. ත්‍රිකුණාමලය |
| | 45. වවුනියාව |



## 1. ප්‍රතිපත්ති සහ පර්යේෂණය (Policy & Research)

- සරල භාෂාවෙන් සියලුම චක්‍රලේඛ නිකුත් කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත හඳුන්වා දීම
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දුක්ගැනවිලි කළමනාකරණ ක්‍රමවේද හඳුන්වා දීම සහ පසු විපරම් කිරීම



## 2. හරිත ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම (Green Productivity Concept)

- මෙම සංකල්පය දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 හා ග්‍රාම නිලධාරී කාර්යාල 14022 තුළ සහ සංවර්ධන නිලධාරීන් 17000 දක්වා ක්‍රියාත්මක කිරීම.
- මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරී කාර්යාලවල සේවයේ නිරත නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම.
- හරිත ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සඳහා අත් පොතක් (Manual) නිර්මාණය කිරීම.
- මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාලවල සහ සංවර්ධන නිලධාරී පුහුණුව ලබා දීම තුළින් මානව සම්පත සංවර්ධනය කිරීම.



## 3. සියලු කාර්යාල සඳහා පෙරටු කාර්යාල ක්‍රමය හඳුන්වාදීම (Front Office System)

- මෙම පෙරටු කාර්යාල ක්‍රමය දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 හා ග්‍රාම නිලධාරී කාර්යාල 14022 තුළ ක්‍රියාත්මක කිරීම.
- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරී කාර්යාල සඳහා පෙරටු කාර්යාල ක්‍රමය හඳුන්වාදීම හා ස්ථාපිත කිරීම.
- පෙරටු කාර්යාල ක්‍රමය දියත් කිරීම හා එහි වැදගත්කම සම්බන්ධයෙන් සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාලවල නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම තුළින් මානව සම්පත සංවර්ධනය කිරීම.



### 4. මානව සම්පත් කළමනාකරණය (Human Resource Management)

(සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් සඳහා)

- සියලුම මාණ්ඩලික හා සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් හඳුන්වාදීම සහ සංවර්ධනය කිරීම
- සියලුම මාණ්ඩලික හා සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා මානව සම්පත්වල කාර්යය සාධනය මැනීම සහ ඇගයීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.
- රාජ්‍ය සේවයේ හා පුද්ගලික සේවයේ වැටුප් පරතරය අඩු කිරීම සඳහා කුසලතාවය සහ තරඟකාරීත්වය පදනම් කර ගත ක්‍රමවේදයක් හඳුන්වා දීම
- දෙවන පෙළ කළමනාකරණය පුහුණු කිරීම හා සංවර්ධනය
- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් ඒකක (HR Cell) පිහිටුවීම
- තුන්දා නීතිය බලාත්මක කිරීම
- සෑම ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරී කාර්යාලකම ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා CheckList හඳුන්වා දීම
- හදිසි පරීක්ෂණ ඒකක හඳුන්වා දීම (පැමිණිලි විමර්ශනය සහ එම කාර්යාල පරීක්ෂා කිරීම)



### 5. අන්තර් කළමනාකරණ තරඟ සංවිධානය කිරීම (Internal Management Competition)

දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 හා ග්‍රාම නිලධාරී කාර්යාල 14,022 තුළ සහ සංවර්ධන නිලධාරීන් සඳහා විවිධත්වයෙන් යුතු අන්තර් කළමනාකරණ තරඟ ක්‍රියාත්මක කිරීම තුළින් නිලධාරීන් දිරි ගැන්වීම.



### 6. විදේශ ශිෂ්‍යත්ව පිරිනැමීම. (Foreign Training & Scholarships)

දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 හා ග්‍රාම නිලධාරී කාර්යාල 14,022 තුළ සහ සංවර්ධන නිලධාරීන් සඳහා විදේශ ශිෂ්‍යත්ව ලබා දීම තුළින් ඔවුන් තුළ ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීම හා සේවකයින් අභිප්‍රේරණය කිරීම.



## 7. තොරතුරු තාක්ෂණය (Information Technology)

- E-citizen පුරවැසි සේවා ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම හා දිරිමත් කිරීම
- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා වාහන කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම
- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා කඩදාසි භාවිතය අවම කිරීමේ පද්ධතියක් හඳුන්වා දීම
- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා තත්කාල (online) විභාග ක්‍රමයක් හඳුන්වාදීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම.
- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් හඳුන්වා දීම



## 8. අන්තර්ජාල බිහිදොර නිර්මාණය (Internet Gateway)

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව අතර එකම අන්තර්ජාල බිහි දොරක් ලෙස ක්‍රියාත්මක වන පරිදි ජාල ගත කිරීම

- ඒ සඳහා අවශ්‍ය පරිගණක හා අදාළ අනෙකුත් උපාංග ලබා දීම
- පුහුණුව ලබා දීම

## 9. ප්‍රාග්ධන වියදම් ප්‍රගතිය අන්තර්ජාලය හරහා තත්කාලීනව සම්බන්ධ විය හැකි මෘදුකාංගයක් නිර්මාණය කිරීම (Software for online connection through Internet)

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, අනෙකුත් සියලුම අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දෙනු ලබන සියලුම ප්‍රතිපාදනයන්හි ප්‍රගතිය එම ප්‍රතිපාදන ලබා දුන් සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත නිරීක්ෂණය කිරීම, අධීක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම, ඇගයීම හා පසුවිපරම් කිරීමට හැකිවන පරිදි අන්තර්ජාලය හරහා තත්කාලීනව (Online) සම්බන්ධ විය හැකි මෘදුකාංගයක් නිර්මාණය කිරීම

- ඒ සඳහා අවශ්‍ය පරිගණක හා අදාළ අනෙකුත් උපාංග ලබා දීම
- පුහුණුව ලබා දීම
- දැනුවත් කිරීම



## 10. නිල මෙහෙවර - ජනපති ජනතා සේවය හඳුන්වා දීම (Nilamehewara – Presidents' Peoples Service)

නිල මෙහෙවර ජංගම සේවාව ක්‍රියාත්මක කිරීම තුලින් මහජනතාවගේ දුක්ගැනවිලි, ගැටළු හඳුනාගැනීම, හඳුනාගත් ගැටළු විසඳීමට යෝජනා ඉදිරිපත් කිරීම



## 11. ඵලදායීතාවය (Productivity)

- සියලුම සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා හරිත විගණනයක් හඳුන්වා දීම
- සේවාලාභීන් සඳහා ඵලදායීතාවය වර්ධනය කිරීම සහ හඳුන්වා දීම
- දැනුම් කළමනාකරණය සහ නව සොයාගැනීම් සඳහා රාජ්‍ය සේවකයින් දිරිමත් කිරීම
- ඵලදායීතා සංකල්පය රාජ්‍ය සේවකයින් අතරට ගෙන යාම සඳහා
  - දැනුවත් කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීම
  - පුහුණු අත්පොත් නිර්මාණය කිරීම
  - ප්‍රයෝගික පුහුණුව

## 12. ප්‍රතිසංස්කරණ (Reforms)

- ප්‍රතිඵලදායක සහ ඉලක්ක ගත සැලසුම් ක්‍රමවේදයක් හඳුවන්වා දීම.
- සේවාලාභීන් සහ සේවාදායකයින් අතර මනා සම්බන්ධීකරණ ක්‍රමවේදයක් හඳුන්වාදීම, දිරිමත්කිරීම හා සංවර්ධනය.
- නවීන කළමනාකරණ සංකල්ප ක්‍රම,නීතිරීති පිළිබඳව දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශනය සැපයීම.
- නවීන ප්‍රතිසංස්කරන ඒකක (Reform cells) සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම.

## 13. සුබසාධන පහසුකම් (Welfare Fascilities)

- රාජ්‍ය සේවකයින් සඳහා සහන පදනම මත නිවාස සැපයීමේ ක්‍රම වැඩිදියුණු කිරීම.
- සහනදායී පදනම මත රජයේ සංචාරක නිවාස, නිවාඩු නිකේතන පහසුකම් රජයේ සේවකයින් වෙත සැපයීම.

## 14. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව (Department of Registrar General)

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා දැනට පරිලෝකනය (Scan) නොකරන ලද උපත්, මරණ හා විවාහ සහතික පරිලෝකනය කර දත්ත පද්ධතියට ඇතුලත් කිරීම.

- 2009 දක්වා මෙම කාර්යය සිදුවී ඇති අතර ඉදිරියට ද සිදුකරගෙන යාම
- මේ තුලින් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පිටපත් ලබා ගැනීමේ හැකියාව ඇති කිරීම මඟින් අඩු කාලයකින් සේවාලාභීන් හට සේවය සැපයීමට කටයුතු කිරීම
- ඊ - උපත්, මරණ හා විවාහ දත්ත පද්ධතිය ආශ්‍රයෙන් දිවයිනේ ඕනෑම තැනකින් පිටපත් ලබා ගැනීමේ හැකියාව





අනුරාධපුර සංචාරක නිවාසය

## නිල මෙහෙවර ජනපති ජනතා සේවාව ගාල්ල දිස්ත්‍රික්කය

## 2016-2017






අතිගරු ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නියමයෙන් සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උපදේශකත්වයෙන් නිලමෙහෙවර ජනපති ජනතා සේවය ජාතික වැඩසටහන, ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමාගේ නායකත්වය යටතේ මහජනතාවගේ කලක පටන් නොවිසඳී ඇති ගැටළු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් හඳුනාගෙන, එම ගැටළුවලට අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධ කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ජනතාවගේ සියළුම ගැටළු එකම වහලක් යටදී විසඳා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසාදීමේ අරමුණින් ආරම්භ කරන ලදී. එහිදී ජනතාවට මෙතෙක් නොවිසඳී ඇති ගැටළු එනම්, ජාතික හැඳුනුම්පත් නොලැබීම, වාහන රියදුරු බලපත්‍ර නොලැබීම, උපත් හා විවාහ, මරණ සහතික ලබා ගැනීමට නොහැකි වීම, ඉඩම් ගැටළු නොවිසඳීම, නිවාස ප්‍රශ්න, ආපදා ගැටළු, කෘෂි කර්මාන්තයට අදාල ගැටළු, ජල ගැටළු, වැඩිහිටි දීමනා ගැටළු, ආදී මෙතෙක් කිසිවෙකුගේ අවධානයට ලක් නොවී පැවති ජනතා ගැටළු වලට ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමාගේ සංකල්පය අනුව, ජනතාව අප වෙත පැමිණීම වෙනුවට අප විසින් ජනතාව වෙත යාම සඳහා සැලසුම් කරන ලද වැඩසටහනකි.

මෙම ජාතික වැඩ සටහනෙහි පළමු අදියර, අතිගරු ජනාධිපතිතුමාගේ දිස්ත්‍රික්කය වන පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි ක්‍රියාත්මක කරන ලද අතර ඉන් ඵලදායී විසඳුම් ලබාදීමට කටයුතු කර ඇත. දෙවන ජාතික වැඩසටහන ලෙස ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමාගේ දිස්ත්‍රික්කය වන ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19ක් තුල ගැටළු 250,000කට ආසන්න ප්‍රමාණයකට විසඳුම් ලබාදීමේ අදහසින් 2016 ඔක්තෝම්බර් මාසයේ සිට 2017 ජනවාරි 14 දක්වා මෙම නිල මෙහෙවර ජනපති ජනතා සේවය වැඩසටහන ඉතා සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉතිරි දිස්ත්‍රික්ක 23 සඳහාද මෙම වැඩසටහන 2017 වර්ෂයේදී සැලසුම් කර ඇත.

## මූලික තොරතුරු - ගාල්ල දිස්ත්‍රික්කය

| | |
|---|---|
| භූමි ප්‍රමාණය (ව.කි.මී.) | 1652 |
| ජනගහනය | 1,102,000 |
| පවුල් සංඛ්‍යාව | 276,377 |
| පළාත් පාලන ආයතන සංඛ්‍යාව | 20 |
| මහ නගර සභා | 01 |
| නගර සභා | 02 |
| ප්‍රාදේශීය සභා | 17 |

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | 19 |
| මැතිවරණ කොට්ඨාස ගණන | 10 |
| ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | 896 |
| ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව | 833,891 |
| ගම්මාන සංඛ්‍යාව | 2477 |
| දරිද්‍රතාවය | 9.9 |
| විරැකියා අනුපාතය | 4.6 |

## නිල මෙහෙවර සඳහා ඉදිරිපත් වු ගැටළු සාරාංශය

| | |
|---|---|
| දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ.කොට්ඨාස සංඛ්‍යාව | 19 |
| පැවැත්වූ නිල මෙහෙවර සංඛ්‍යාව | 21 |
| ඉදිරිපත්වූ ගැටළු සංඛ්‍යාව | 140,956 |
| විසඳන ලද ගැටළු සංඛ්‍යාව | 137,681 |
| ගැටළු විසඳීමේ ප්‍රගතිය (%) | 97.7% |
| ජාතික මට්ටමින් විසඳිය යුතු ගැටළු සංඛ්‍යාව | 3275 |

## ජනතාවට ලබා දුන් ප්‍රතිලාභ හා මූල්‍ය වටිනාකම

භාණ්ඩ හා සේවා ලබා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 56402

මුළු භාණ්ඩ හා සේවා සංඛ්‍යාව 67064



**ලබා දුන් භාණ්ඩ හා සේවාවල දළ මූල්‍ය වටිනාකම රු.මි.26.69**




**නිල මෙහෙවර යටතේ රජයේ දළ ආදායම රු.මි. 23.35 (රියදුරු බලපත්‍ර මගින් ලද දළ ආදායම)**

| ප්‍රා. ලේ. කොට්ඨාසය | ග්‍රා.නි.වසම් සංඛ්‍යාව |
|---|---|
| අක්මීමණ | 63 |
| අම්බලන්ගොඩ | 36 |
| බද්දේගම | 70 |
| බලපිටිය | 52 |
| බෙන්තොට | 51 |
| බෝපේ පෝද්දල | 44 |
| ඇල්පිටිය | 51 |
| කඩවත්සතර | 50 |
| ගෝනාපීනුවල | 19 |
| හබරාදුව | 59 |
| හික්කඩුව | 97 |
| ඉමදුව | 43 |
| කරන්දෙණිය | 40 |
| නාගොඩ | 53 |
| නෙළුව | 34 |
| නියාගම | 34 |
| තවලම | 36 |
| වැලිවිටිය දිවිතුර | 20 |
| යක්කලමුල්ල | 44 |
| එකතුව | 896 |


## අංශ අනුව හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනය - 2016

ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය අංශයේ ජනගහනය, මුළු ජනගහනයෙන් 85% ක ප්‍රතිශතයක් ගනී.

| අංශය | ජනගහනය |
|---|---|
| නාගරික | 136,869 |
| ග්‍රාමීය | 934,866 |
| වතු | 19,266 |
| එකතුව | 1,091,000 |





| වර්ගය | ජනගහනය |
|---|---|
| ස්ත්‍රී | 567,831 |
| පුරුෂ | 523,169 |
| එකතුව | 1,091,000 |



### කර්මාන්ත අනුව ජනගහන ප්‍රතිශතය

| අංශය | ජනගහන ප්‍රතිශතය |
|---|---|
| කෘෂිකර්මාන්තය | 32.6 |
| කාර්මික | 28.3 |
| සේවා | 39.1 |




### නිවාස අශාතා

| | |
|---|---|
| මුළු නිවාස | 282,555 |
| පොල් අතු සෙවිලි කළ නිවාස | 211 |
| තහඩු සෙවිලි කළ නිවාස | 4,865 |
| කපරාරු කළ යුතු නිවාස | 30,555 |
| අඩක් ඉදිකළ නිවාස | 12,555 |
| ඉඩමක් නැති නිවාස නැත පවුල් | 8,982 |
| ඉඩමක් ඇති නිවාස නැති පවුල් | 2,985 |
| තාවකාලිකව කුලියට/බද්දට සිටින | 1,737 |
| ස්ථිර පදිංචියට කුලියට/බද්දට සිටින | 1,605 |
| රැකියාව සඳහා නිල නිවාසවල සිටින | 511 |
| විදුලිය නැති | 4,433 |
| මාර්ග පහසුකම් නැති | 6,356 |
| සනීපාරක්‍ෂක පහසුකම් නැති | 6,806 |
| පානීය ජලය නැති | 11,729 |

### ඉඩම් සංවර්ධන ආඥා පනත සහ ඉඩම් ප්‍රධාන (විශේෂ විධිවිධාන) පනත යටතේ බෙදා දී ඇති ඉඩම් පිළිබඳ විස්තර

| | | |
|---|---|---|
| නිකුත් කර ඇති ඉ.සං.ආ. බලපත්‍ර ගණන | | 93,175 |
| නිකුත් කර ඇති ඉ.සං.ආ. දීමනාපත්‍ර ගණන | පිඹුරක් සහිත දීමනා පත්‍ර ගණන | 30,552 |
| | මැන නැති (ජයභූමි)දීමනා පත්‍ර ගණන | 28,392 |
| නිකුත් කර ඇති නියාදන සාධන පත්‍ර ගණන | | 2,422 |
| ඉ.සං.ආ දීමනා පත්‍ර නිකුත් කිරීමට ඉතිරිව ඇති බලපත්‍ර ගණන | | 39,907 |

### ප්‍රධාන සෞඛ්‍ය සංරචක දත්තයන්

| | |
|---|---|
| මාතෘ මරණ අනුපාතය (සජීව උපත් (100000කට) | 22 |
| ළදරු මරණ අනුපාතය (සජීව උපත් 1000 කට) | 7.5 |
| ළමා අඩු බර ප්‍රතිශතය අවු. 1 - 2 % | 14.87 |
| ළමා අඩු බර ප්‍රතිශතය අවු. 2 - 5 % | 27.26 |
| ඩෙංගු උණ රෝගීන් වාර්තා වීම | 947 |
| මානව ජල භීතිකා මරණ වාර්තා වීම | 1 |

## ජනතාවට දුන් ප්‍රතිලාබ

| ලබා දුන් ප්‍රතිලාභය | ගණන |
|---|---|
| ඇස් කණ්ණාඩි | 10488 |
| රෝද පුටු | 39 |
| අත්වාරු | 17 |
| කිහිලිකරු | 12 |
| සමාජ සේවා වෙනත් ආධාර | 443 |
| වැඩිහිටි හැඳුනුම්පත් | 3906 |
| ඉඩම් දීමනා පත්‍ර හා බලපත්‍ර | 2865 |
| ජීවනෝපාය සඳහා උපකරණ හා රෝපණ ද්‍රව්‍ය | 3048 |
| නිවාස සඳහා සිමෙන්ති මළු | 3073 |
| ක්‍රීඩා/දහම් පාසල් උපකරණ,ආපදා ආධාර හා වෙනත් | 1235 |
| ජාතික හැඳුනුම්පත් ගණන | 16205 |
| උප්පැන්න,විවාහ හා මරණ සහතික පිටපත් ගණන | 18282 |
| ලියාපදිංචි නොවූ විවාහ ලියාපදිංචි කිරීම් | 49 |
| රියදුරු බලපත්‍ර(නව හා සංශෝධන අනෙකුත් සේවා) | 7037 |

## ජාතික මට්ටමින් විසඳීමට ඇති ගැටළු

| | ප්‍රා.ලේ. කොට්ඨාසය | ක්ෂේත්‍රය | | | |
|---|---|---|---|---|---|
| | | ඉඩම් | දිවි නැගුම | නිවාස | එකතුව |
| 1 | නියාගම | 525 | | 230 | 755 |
| 2 | වැලිවිටිය දිවිතුර | | 142 | | 142 |
| 3 | ඇල්පිටිය | | | | 0 |
| 4 | බද්දේගම | | 366 | | 366 |
| 5 | හික්කඩුව | | 465 | | 465 |
| 6 | අම්බලන්ගොඩ | | 136 | | 136 |
| 7 | කඩවත් සතර | | | | 0 |
| 8 | හබරාදූව | | 338 | | 338 |
| 9 | ඉමදූව | | 200 | | 200 |
| 10 | යක්කලමුල්ල | | | | 0 |
| 11 | බෙන්තොට | | | | 0 |
| 12 | බලපිටිය | 66 | | | 66 |
| 13 | කරන්දෙණිය | | | | 0 |
| 14 | නෙළුව | 80 | | | 80 |
| 15 | අක්මීමණ | 21 | 179 | 20 | 220 |
| 16 | ගෝනාපීනුවල | | 78 | | 78 |
| 17 | බෝපේ පෝද්දල | | 127 | | 127 |
| 18 | තවලම | | 302 | | 302 |
| 19 | නාගොඩ | | | | 0 |
| | එකතුව | 692 | 2333 | 250 | 3275 |



